
# මහා සභා

# රැස්වීම් වාර්තාව

# 2023.01.03



මීගහකිවුල ප්‍රාදේශීය සභාව

055-2245775

## 2023.01.03 දින පැවති මාසික මහා සභා රැස්වීම් වාර්තාව
## මීගහකිවුල ප්‍රාදේශීය සභාව

**පැමිණීම.**

01. ගරු සභාපති - එස්.එම්.එල්.එච්.ජයවර්ධන මැතිතුමා
02. ගරු උප සභාපති - ඩබ්.එම්.සමන්ත කුමාර මැතිතුමා
03. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස්.එම්.රංගන මධුමාල් සමරකෝන් මැතිතුමා
04. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.පී.කපිල ආනන්ද රාජපක්ෂ මැතිතුමා
05. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - සුමතිපාල උඩලකුඹුර මැතිතුමා
06. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ටී.එම්.ශ්‍රියාලතා මැතිණිය
07. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.එම්.නිමල් දිසානායක මැතිතුමා
08. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.එම්.ශ්‍රියාණි සාමාවතී මැතිණිය
09. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.එම්.නිශාදි ශිරන්තිකා මැතිණිය
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.පී. බාලසුන්දරම් මැතිතුමා
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.එම්.රත්නතිස්ස මැතිතුමා
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.ආර්.චන්ද්‍රසිරි දිසානායක මැතිතුමා
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එන්.එන්.එම්.නන්දන සම්පත් උදය කුමාර මැතිතුමා
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.එම්.චමින්ද ප්‍රදීප් මැතිතුමා
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.එම්.මංජුල දිසානායක මැතිතුමා
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.එම්.පත්මා කුමාරි මැතිණිය
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.එම්.නාමල් රත්නායක මැතිතුමා
18. සභා ලේකම් - ඩී.එම්.කේ.ඩී.දිසානායක මෙය
19. විෂය නිලධාරි - ආර්.එම්.නිල්මිණි සකුන්තලා මිය

**සභාව ආරම්භ කිරිම.**

පෙ.ව.10.00ට ගරු සභාපතිතුමා මූලාසනය ගනිමින් පැමිණ සිටි ගරු උප සභාපතිතුමා,ගරු මන්ත්‍රීතුමන්ලාත්, ගරු මන්ත්‍රීතුමියන්ලාත්, සභා ලේකම්තුමිය හා විෂය නිලධාරි පිළිගනිමින් සභා රැස්වීම් කටයුතු ආරම්භ කරන ලදී. මූලාසනය විසින් එදින න්‍යාය පත්‍රානුකූලව මුලින්ම පසුගිය මහා සභා රැස්වීම් වාර්තාව සම්මත කිරීමට සභාවට ඉදිරිපත් කරන ලදී.

**(අ) පසුගිය සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කර ගැනීම.**

මෙහිදී මූලාසනය සභාව අමතමින් ගරු මන්ත්‍රීවරුනි, පසුගිය මහා සභා රැස්වීම් වාර්තාව කියෙව්වා සේ සළකා සභා යෝජනා ස්ථිරත්වයෙන් සම්මත කර, සභා වාර්තාවල සංශෝධන තිබේ නම් ඉදිරිපත් කරන ලෙස මම තමුන්නාන්සේලාගෙන් ඉල්ලා සිටිනවා.

**මූලාසනය අමතමින්,පසුගිය මහා සභා රැස්වීම් වාර්තාව සත්‍ය වාර්තාවක් බැවින් සභා සම්මත කිරීම, සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ආර්.චන්ද්‍රසිරි දිසානායක මැතිතුමා යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.පත්මා කුමාරි මැතිණිය විසින් ස්ථිර කරන ලදී.**

මූලාසනය සභාව අමතමින්, පසුගිය සභා වාර්තාවේ සංශෝධන තිබේ නම් ඉදිරිපත් කරන ලෙස මම මේ ගරු සභාවට දන්වා සිටිනවා.

**මූලාසනය සභාව අමතමින්, පසුගිය සභා වාර්තාවේ සංශෝධන කිසිවක් නොමැති බව පෙනී යන බැවින්, පසුගිය මහා සභා වාර්තාව සම්මත කිරීම සඳහා මූලාසනය විසින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය විමසා, සභාවේ සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත පසුගිය මහා සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත වූ බව සභාවට දන්වන ලදී.**

මූලාසනය සභාව අමතා න්‍යාය පත්‍රානුකූලව විශේෂ නිවේදන ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලදී.

**(ආ) ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදන.**

මූලාසනය සභාව අමතමින් මෙම සභා වාරය සඳහා විශේෂ නිවේදන කිසිවක් ලැබී නොමැති බව, මා මේ ගරු සභාවට ප්‍රකාශ කරනවා.

මූලාසනය සභාව අමතා න්‍යාය පත්‍රානුකූලව සංදේශ,පැමිණිලි,පෙත්සම් හා ආයාචනා ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලදී.

**(ඇ) සංදේශ, පෙත්සම්,පැමිණිලි සහ ආයාචනා සභා ගත කිරීම.**

මූලාසනය සභාව අමතමින්. මෙම සභා වාරය සඳහා සංදේශ,පැමිණිලි,පෙත්සම් හා ආයාචනා කිසිවක් ලැබී නොමැති බව, මා මේ ගරු සභාවට ප්‍රකාශ කරනවා.

මීළඟට මූලාසනය සභාව අමතා න්‍යාය පත්‍රානුකූලව කල්දෙනු ලැබූ ප්‍රශ්න ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලදී.

**(ඈ) කල්දෙනු ලැබූ ප්‍රශ්න.**

මූලාසනය සභාව අමතමින්. මෙම සභා වාරය සඳහා කල් දෙනු ලැබූ ප්‍රශ්න කිසිවක් ලැබී නොමැති බව, මා මේ ගරු සභාවට ප්‍රකාශ කරනවා.

මීළඟට මූලාසනය සභාව අමතා, න්‍යාය පත්‍රානුකූලව යථා පරිදි කල් දී ඇති යෝජනා ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලදී.

(ඉ) යථා පරිදි කල් දී ඇති යෝජනා.

මූලාසනය විසින් පළමු යෝජනාව සභාව හමුවේ තබන ලදී.

1) මූලාසනය විසින් සභාව අමතමින්, මීගහකිවුල කොට්ඨාසය තුල මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු ඉඩම විශාල සංඛ්‍යාවක් ඇති අතර, එම ඉඩම්වල ගොඩක් අය පදිංචි වෙලා සිටිනවා. එම පදිංචිකරුවන්ගෙන් සභාවට ආදායමක් ලැබෙන ලෙස එම ඉඩම් වලින් බදු අයකර ගැනීම සම්බන්ධ යෝජනාව සභා ගත කරන ලදී.

**මීගහකිවුල කොට්ඨාසය තුල මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු ඉඩම් විශාල සංඛ්‍යාවක් ඇති අතර, එම ඉඩම් වල ගොඩක් අය පදිංචි වෙලා සිටිනවා. එම පදිංචිකරුවන්ගෙන් සභාවට ආදායමක් ලැබෙන ලෙස එම ඉඩම් වලින් බදු අයකර ගැනීම සඳහා සභා අනුමැතිය ලබා දීම සුදුසු බව, ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඩබ්.එම්.සමන්ත කුමාර මැතිතුමා යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.රංගන මධුමාල් සමරකෝන් මැතිතුමා ස්ථිර කළේය.**

**මූලාසනය විසින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාව විමසා සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාව මත, එම යෝජනාව ඒකමතිකව සහා සම්මත වූ බව ප්‍රකාශ කරන ලදී.**

මූලාසනය සභාව අමතා න්‍යාය පත්‍රානුකූලව හදිසි යෝජනා ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලදී.

හදිසි යෝජනා

මූලාසනය සභාව අමතමින්, හදිසි යෝජනා අංක 01 ඉදිරිපත් කරන ලදී.

01) මූලාසනය විසින් සභාව අමතමින්, මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු පරණ බස් නැවතුම්පොලෙහි එක් කුටියක් මාර්ගස්ථ ප්‍රවාහන අධිකාරියට ලබා දීම සම්බන්ධ යෝජනාව සභා ගත කරන ලදී.

**මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු පරණ බස් නැවතුම්පොලෙහි එක් කුටියක් මාර්ගස්ථ ප්‍රවාහන අධිකාරියට ලබා දීම සඳහා සභා අනුමැතිය ලබා දීම සුදුසු බව, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.රංගන මධුමාල් සමරකෝන් මැතිතුමා යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී.කපිල ආනන්ද රාජපක්ෂ මැතිතුමා ස්ථිර කළේය.**

**මූලාසනය විසින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාව විමසා සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාව මත, එම යෝජනාව ඒකමතිකව සහා සම්මත වූ බව ප්‍රකාශ කරන ලදී.**

මීළඟට මූලාසන සභාව අමතමින්, හදිසි යෝජනා අංක 02 ඉදිරිපත් කරන ලදී.

02) මූලාසනය සභාව අමතමින්, මීගහකිවුල ප්‍රාදේශීය සභාවට අයත් UPPE-5483 නිළ කැබ් රථය සඳහා 2022 දෙසැම්බර් මස අනුමත ඉන්ධන සීමාව ඉක්මවා වැය කළ අමතර ඉන්ධන ලීටර් 53 සඳහා සභා අනුමැතිය ලබා ගැනීම සඳහා සභා ගත කරන ලදී.

**මීගහකිවුල ප්‍රාදේශීය සභාවට අයත් UPPE-5483 නිළ කැබ් රථය සඳහා 2022 දෙසැම්බර් මස අනුමත ඉන්ධන සීමාව ඉක්මවා වැය කළ අමතර ඉන්ධන ලීටර් 53 සඳහා සභා අනුමැතිය ලබා දීම සුදුසු බව, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.රංගන මධුමාල් සමරකෝන් මැතිතුමා යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඩබ්.එම්.සමන්ත කුමාර මැතිතුමා ස්ථිර කළේය.**

**මූලාසනය විසින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාව විමසා සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාව මත, එම යෝජනාව ඒකමතිකව සහා සම්මත වූ බව ප්‍රකාශ කරන ලදී.**

මීළඟට මූලාසන සභාව අමතමින්, හදිසි යෝජනා අංක 03 ඉදිරිපත් කරන ලදී.

03) මූලාසනය සභාව අමතමින්, මීගහකිවුල නගරයේ කඩ කාමර වර්ෂ 2019 තක්සේරුවට අනුව 2019 ඔක්තෝම්බර් 01 සිට 2022 සැප්තැම්බර් 30 දක්වා එම තක්සේරුවට අදාල කඩකුළී අය කරන ලදී. ඒ අනුව 2022 සැප්තැම්බර් මස වන තෙක් නව තක්සේරුව සිදු කිරීමට තක්සේරු දෙපාර්තමේන්තුවට නොහැකිවීම මත ඉන්පසු 2022.09.09 දින පැවති සභාවෙන් 2022.12.31 දක්වා පවතින කඩ කුලී මුදලම අයකිරීමට සභා අනුමැතිය ලබා දෙන ලදී. ඒ අනුව 2022.12.01 දිනට පෙර නව තක්සේරු දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටියද ඔවුන්ගේ කාර්ය මණ්ඩලයෙහි පවතින පුරප්පාඩු මත මේ වන තෙක් අදාල කඩ තක්සේරුව සිදු කිරීමට නොහැකි වූ බව දන්වන ලද අතර හැකි ඉගස තක්සේරුව සිදු කර දෙන බව දුරකතනය මඟින් දන්වන ලදී. එසේ හෙයින් 2022.10.01 දින සිට වසර 03කින් කඩ ගිවිසුම් දීර්ඝ කිරීමට හා නව තක්සේරුව තක්සේරු දෙපාර්තමේන්තුවෙන් සිදු කරන තෙක් 2023.01.01 දින සිට තාවකාලිකව ගාස්තු සංශෝධනය කර අය කිරීම හෝ පවතින කඩ කුලී ගාස්තු අය කිරීම සඳහා අවශ්‍ය සභා අනුමැතිය සඳහා සභා ගත කරන ලදී.

**මූලාසනය සභාව අමතමින් පෙ.ව.10.50ට ගරු මන්ත්‍රීවරුනි,මේ මහා සභාව කාරක සභාවක් බවට පත් කිරීම සුදුසු බව, ගරු ප්‍රාදේශීය සභා සභාපති එස්.එම්.එල්.එච්.ජයවර්ධන මැතිතුමා යෝජනා කරන අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඩබ්.එම්.සමන්ත කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

**මූලාසනය විසින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාව විමසා සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාව මත, මහා සභාව කාරක සභාවක් බවට පත් කිරීම ඒකමතිකව සහා සම්මත වූ බව ප්‍රකාශ කරන ලදී.**

**මූලාසනය සභාව අමතමින් පෙ.ව.10.55ට කාරක සභා අවස්ථාව මහා සභාවක් බවට පත් කිරීම සඳහා ගරු ප්‍රාදේශීය සභා සභාපති එස්.එම්.එල්.එච්.ජයවර්ධන මැතිතුමා යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඩබ්.එම්.සමන්ත කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

**මූලාසනය විසින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාව විමසා සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාව මත, කාරක සභාව මහා සභාවක් බවට පත් කිරීම ඒකමතිකව සහා සම්මත වූ බව ප්‍රකාශ කරන ලදී.**

කාරක සභා අවස්ථාවේදී, මීගහකිවුල නගරයේ කඩකාමර කුලී සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදී.

**ඒ අනුව, 2022.12.01 දිනට පෙර නව තක්සේරුව සිදු කර දෙන ලෙස තක්සේරු දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටියද ඔවුන්ගේ කාර්ය මණ්ඩලයෙහි පවතින පුරප්පාඩු මත මේ වන තෙක් අදාල කඩ තක්සේරුව සිදු කර නොමැත. එබැවින් 2022.10.01 දින සිට වසර 03කින් කඩ ගිවිසුම් දීර්ඝ කිරීම හා 2019.10.01 දින සිට ක්‍රියාත්මකව පැවති තක්සේරු කඩකුලී ගාස්තුව ඉදිරියේදී අයකර ගෙන නව තක්සේරුව පැමිණි විගස නව තක්සේරුව ක්‍රියාත්මක කල යුතු දින සිට එම මුදල අය කර ගැනීම සඳහා හා ක්‍රියාත්මක දින සිට හිඟ මුදලද අය කර ගැනීමට කටයුතු සිදු කිරීම සඳහා සභා අනුමැතිය ලබා දීම සුදුසු බව, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.රංගන මධුමාල් සමරකෝන් මැතිතුමා යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී.කපිල ආනන්ද රාජපක්ෂ මැතිතුමා ස්ථිර කළේය.**

**මූලාසනය විසින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාව විමසා සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාව මත , එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව ප්‍රකාශ කරන ලදී.**

මීළගට මූලාසන සභාව අමතමින්, හදිසි යෝජනා අංක 04 ඉදිරිපත් කරන ලදී.

**04)** මූලාසනය සභාව අමතමින්, මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුතු කාර්මික නිලධාරි (පුහුණු) තනතුර සඳහා 2022.04.01 දින සිට පත්වීම් ලද බී.එම්.හිරන්ත ලක්ෂාන් මයා විසින් 2022.12.29 දිනැති ඉල්ලීම් ලිපිය මඟින් ක්ෂේත්‍ර රාජකාරි සඳහා ගෙවන සංයුක්ත දීමානව ඔහුගේ පත්වීම් ලද දින සිට රු:5,000.00ක දීමාවකට යටත්ව හා පොදුවේ කාර්මික නිලධාරි (පුහුණු) තනතුරට අදාල සංයුක්ත දීමනාව ලෙස රු:5,000.00 ගෙවීමට සඳහා අවශ්‍ය සභා අනුමැතිය සඳහා සභා ගත කරන ලදී.

**මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුතු කාර්මික නිලධාරි (පුහුණු) තනතුර සඳහා 2022.04.01 දින සිට පත්වීම් ලද බී.එම්.හිරන්ත ලක්ෂාන් මයා විසින් 2022.12.29 දිනැති ඉල්ලීම් ලිපිය මඟින් ක්ෂේත්‍ර රාජකාරි සඳහා ගෙවන සංයුක්ත දීමානව ඔහුගේ පත්වීම් ලද දින සිට රු:5,000.00ක දීමාවකට යටත්ව හා පොදුවේ කාර්මික නිලධාරි (පුහුණු) තනතුරට අදාල සංයුක්ත දීමනාව ලෙස රු:5,000.00 ගෙවීමට සඳහා සභා අනුමැතිය ලබා දීම සුදුසු බව, ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඩබ්.එම්.සමන්ත කුමාර මැතිතුමා යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී.කපිල ආනන්ද රාජපක්ෂ මැතිතුමා ස්ථිර කළේය.**

**මූලාසනය විසින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාව විමසා සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාව මත, එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව ප්‍රකාශ කරන ලදී.**

මීළගට මූලාසන සභාව අමතමින්, හදිසි යෝජනා අංක 05 ඉදිරිපත් කරන ලදී.

**05)** මූලාසනය සභාව අමතමින්, මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුතු කාර්මික නිලධාරි (සිවිල්) තනතුර සඳහා ආර්.එම්.ලක්ෂ්මන් ජයසිරි රත්නායක මයා විසින් 2023.01.02 දිනැති ඉල්ලීම් ලිපිය මඟින් කාර්යාල සහ ක්ෂේත්‍ර රාජකාරි ඉටු කිරීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අත්සනින් නිකුත් කර ඇති රැකියා විස්තරයේ සඳහන් පරිදි කාර්යයන් 38 යටතේ සේවාව සපයනු ලබන අතර ආයතන ප්‍රධානියා විසින් පවරන රාජකාරි කටයුතු කාර්යක්ෂම ඉටු කිරීමට බැදී සිටින බව සදහන් කර ඇත. ක්ෂේත්‍ර රාජකාරි කටයුතු සිදු කිරීමේදී කාර්මික නිලධාරින් සඳහා හිමි ක්ෂේත්‍ර දීමනාව මාසිකව උපරිම දින 10 යටත්ව ලබා ගැනීම සඳහා අවශ්‍ය සභා අනුමැතිය සඳහා සභා ගත කරන ලදී.

**මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුතු කාර්මික නිලධාරි (සිවිල්) තනතුර සඳහා ආර්.එම්.ලක්ෂ්මන් ජයසිරි රත්නායක මයා විසින් 2023.01.02 දිනැති ඉල්ලීම් ලිපිය මඟින් කාර්යාල සහ ක්ෂේත්‍ර රාජකාරි ඉටු කිරීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අත්සනින් නිකුත් කර ඇති රැකියා විස්තරයේ සඳහන් පරිදි කාර්යයන් 38 යටතේ සේවාව සපයනු ලබන අතර ආයතන ප්‍රධානියා විසින් පවරන රාජකාරි කටයුතු කාර්යක්ෂම ඉටු කිරීමට බැදී සිටින බව සඳහන් කර ඇත. ක්ෂේත්‍ර රාජකාරි කටයුතු සිදු කිරීමේදී කාර්මික නිලධාරින් සඳහා හිමි ක්ෂේත්‍ර දීමනාව මාසිකව උපරිම දින 10 යටත්ව ලබා දීම සඳහා සභා අනුමැතිය ලබා දීම සුදුසු බව, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී.කපිල ආනන්ද රාජපක්ෂ මැතිතුමා යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුමතිපාල උඩලකුඹුර මැතිතුමා ස්ථිර කළේය.**

**මූලාසනය විසින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාව විමසා සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාව මත, එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව ප්‍රකාශ කරන ලදී.**

මීළගට මූලාසන සභාව අමතමින්, හදිසි යෝජනා අංක 06 ඉදිරිපත් කරන ලදී.

06) මූලාසනය සභාව අමතමින්, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.රංගන මධුමාල් සමරකෝන් මැතිතුමාගේ රු: 75,000.00 ප්‍රතිපාදන යටතේ තල්දෙන ශ්‍රී සරණපාල දහම් පාසල සඳහා 6X4 ප්‍රමාණයේ වයිට් බෝඩ් ලබා දීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම සම්බන්ධ යෝජනාව සභා ගත කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.රංගන මධුමාල් සමරකෝන් මැතිතුමාගේ රු: 75,000.00 ප්‍රතිපාදන යටතේ තල්දෙන ශ්‍රී සරණපාල දහම් පාසල සඳහා 6X4 ප්‍රමාණයේ වයිට් බෝඩ් ලබා දීම සඳහා සභා අනුමැතිය ලබා දීම සුදුසු බව, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.රංගන මධුමාල් සමරකෝන් මැතිතුමා යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.චමින්ද ප්‍රදීප් මැතිතුමා ස්ථිර කළේය.**

**මූලාසනය විසින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාව විමසා සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාව මත, එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව ප්‍රකාශ කරන ලදී.**

මීළගට මූලාසන සභාව අමතමින්. හදිසි යෝජනා අංක 07 ඉදිරිපත් කරන ලදී.

07) මූලාසනය සභාව අමතමින්, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී.කපිල ආනන්ද රාජපක්ෂ මැතිතුමාගේ රු: 75,000.00 ප්‍රතිපාදන යටතේ සමගි අවමංගල්‍ය සමිතිය සඳහා මේසයක්, පුටු 06ක්, FM බඟල් කට්ටලයක්, බුෆේ සෙට් එකක් ලබා දීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම සම්බන්ධ යෝජනාව සභා ගත කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී.කපිල ආනන්ද රාජපක්ෂ මැතිතුමාගේ රු: 75,000.00 ප්‍රතිපාදන යටතේ සමගි අවමංගල්‍ය සමිතිය සඳහා මේසයක්, පුටු 06ක්, FM බඟල් කට්ටලයක්, බුෆේ සෙට් එකක් ලබා දීම සඳහා සභා අනුමැතිය ලබා දීම සුදුසු බව, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී.කපිල ආනන්ද රාජපක්ෂ මැතිතුමා යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ආර්.චන්ද්‍රසිරි දිසානායක මැතිතුමා ස්ථිර කළේය.**

**මූලාසනය විසින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාව විමසා සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාව මත, එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව ප්‍රකාශ කරන ලදී.**

මීළඟට මූලාසන සභාව අමතමින්, හදිසි යෝජනා අංක 08 ඉදිරිපත් කරන ලදී.

08) මූලාසනය සභාව අමතමින්, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුමතිපාල උඩලකුඹුර මැතිතුමාගේ රු: 75,000.00 ප්‍රතිපාදන යටතේ සමිතිය සඳහා ශබ්දවාහිනී යන්ත්‍රයක් ලබා දීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම සම්බන්ධ යෝජනාව සභා ගත කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුමතිපාල උඩලකුඹුර මැතිතුමාගේ රු: 75,000.00 ප්‍රතිපාදන යටතේ සමිතිය සඳහා ශබ්දවාහිනී යන්ත්‍රයක් ලබා දීම සඳහා සභා අනුමැතිය ලබා දීම සුදුසු බව, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුමතිපාල උඩලකුඹුර මැතිතුමා යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දිසානායක මැතිතුමා ස්ථිර කළේය.**

**මූලාසනය විසින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාව විමසා සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාව මත, එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව ප්‍රකාශ කරන ලදී.**

මීළඟට මූලාසන සභාව අමතමින්, හදිසි යෝජනා අංක 09 ඉදිරිපත් කරන ලදී.

09) මූලාසනය සභාව අමතමින්, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.චමින්ද ප්‍රදීප් මැතිතුමාගේ රු: 75,000.00 ප්‍රතිපාදන යටතේ තල්දෙන නිසල යෞවන සමාජය සඳහා ක්‍රිකට් බැට් 01ක් (SS,SF,CA), අත් ආවරන 04ක් (SS,SF,CA), පපු ආවරණ 01ක් (SS,SF) ලබා දීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම සම්බන්ධ යෝජනාව සභා ගත කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.චමින්ද ප්‍රදීප් මැතිතුමාගේ රු: 75,000.00 ප්‍රතිපාදන යටතේ තල්දෙන නිසල යෞවන සමාජය සඳහා ක්‍රිකට් බැට් 01ක් (SS,SF,CA), අත් ආවරන 04ක් (SS,SF,CA), පපු ආවරණ 01ක් (SS,SF) ලබා දීම සඳහා සභා අනුමැතිය ලබා දීම සුදුසු බව, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.චමින්ද ප්‍රදීප් මැතිතුමා යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඩබ්.එම්.සමන්ත කුමාර මැතිතුමා ස්ථිර කළේය.**

**මූලාසනය විසින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාව විමසා සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාව මත, එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව ප්‍රකාශ කරන ලදී.**

මීළඟට මූලාසන සභාව අමතමින්, හදිසි යෝජනා අංක 10 ඉදිරිපත් කරන ලදී.

10) මූලාසනය සභාව අමතමින්, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.පත්මා කුමාරි මැතිණියගේ රු: 75,000.00 ප්‍රතිපාදන යටතේ කළුගහකඳුර, සියඹලාගස්ලන්ද, චාන්දනී නිවස පදිංචි ආර්.එම්.ඉනෝකා චාන්දනී මිය හා කළුගහකඳුර, වෙන්දේසියාය, නන්දන සෙවන පදිංචි ටී.එම්.කමලාවතී මිය අය සඳහා සිමෙන්ති ලබා දීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම සම්බන්ධ යෝජනාව සභා ගත කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.පත්මා කුමාරි මැතිණියගේ රු: 75,000.00 ප්‍රතිපාදන යටතේ කළුගහකඳුර, සියඹලාගස්ලන්ද, චාන්දනී නිවස පදිංචි ආර්.එම්.ඉනෝකා චාන්දනී මිය හා කළුගහකඳුර, වෙන්දේසියාය, නන්දන සෙවන පදිංචි ටී.එම්.කමලාවතී මිය අය සඳහා සිමෙන්ති ලබා දීම සඳහා සභා අනුමැතිය ලබා දීම සුදුසු බව, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.පත්මා කුමාරි මැතිණිය යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දිසානායක මැතිතුමා ස්ථිර කළේය.**

**මූලාසනය විසින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාව විමසා සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාව මත, එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව ප්‍රකාශ කරන ලදී.**

මීළඟට මූලාසන සභාව අමතමින්, හදිසි යෝජනා අංක 11 ඉදිරිපත් කරන ලදී.

11) මූලාසනය සභාව අමතමින්, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ශ්‍රියාලතා මැතිණියගේ රු: 75,000.00 ප්‍රතිපාදන යටතේ මීගහකිවුල, බලගොල්ල, එක්සත් සුභසාධන හා අවමංගල්‍යාධාර සමිතිය සඳහා බුෆේ සෙට් ලබා දීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම සම්බන්ධ යෝජනාව සභා ගත කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ශ්‍රියාලතා මැතිණියගේ රු: 75,000.00 ප්‍රතිපාදන යටතේ මීගහකිවුල, බලගොල්ල, එක්සත් සුභසාධන හා අවමංගල්‍යාධාර සමිතිය සඳහා බුෆේ සෙට් ලබා දීම සඳහා සභා අනුමැතිය ලබා දීම සුදුසු බව, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ශ්‍රියාලතා මැතිණිය යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී.කපිල ආනන්ද රාජපක්ෂ මැතිතුමා ස්ථිර කළේය.**

**මූලාසනය විසින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාව විමසා සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාව මත, එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව ප්‍රකාශ කරන ලදී.**

මීළඟට න්‍යාය පත්‍රානුකූලව කාරක සභා වාර්තා සලකා බැලීම සම්බන්ධයෙන් 2023.01.02 වන දින මුදල් කමිටු වාර්තාව ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලදී.

## 2023/01/02 දින මීගහකිවුල ප්‍රාදේශීය සභාවේදී පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු රැස්වීම් වාර්තාව

2023/01/02 වන දින පෙ.ව.10.00ට ගරු සභාපතිතුමා විසින් පැමිණ සිටි ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.නිමල් දිසානායක මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.පත්මා කුමාරි මැතිණිය, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ආර්.චන්ද්‍රසිරි දිසානායක මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී.බාලසුන්දරම් මැතිතුමා, ලේකම්තුමිය හා විෂය නිළධාරි පිළිගනිමින් මුදල් හා ප්‍රතිපත්ති කමිටුව ආරම්භ කරන ලදී.

මීළඟට, න්‍යාය පත්‍රානුකූලව ගරු සභාපතිතුමා විසින් 2022/12/08 දිනැති පසුගිය රැස්වීම් වාර්තාව ඉදිරිපත් කරන ලදී. පසුගිය රැස්වීම් වාර්තාව සත්‍ය වාර්තාවක් බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.චන්ද්‍රසිරි දිසානායක මැතිතුමා යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.නිමල් දිසානායක මැතිතුමා ස්ථිර කළේය.

න්‍යාය පත්‍රානුකූලව දිනට නියමිත කරුණු සාකච්ඡාවට භාජනය කරන ලදී.

ගරු සභාපතිතුමා විසින් පළමු කරුණ කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී. ඒ අනුව 2022 දෙසැම්බර් මස 01 සිට 28 දක්වා ආදායම්, වියදම් හා ඉන්ධන වාර්තා කමිටුවේ නිර්දේශය සඳහා ඉදිරිපත් කළ අතර, 2022 වර්ෂයේ දෙසැම්බර් මස 01 සිට 28 දක්වා ආදායම්, වියදම් හා ඉන්ධන වාර්තා අනුමත කිරීම සඳහා නිර්දේශය ලබාදීම සුදුසු බව කමිටුව තීරණය කරන ලදී.

මීගහකිවුල ප්‍රාදේශීය සභාවට අයත් UPPE-5483 නිළ කැබ් රථය සඳහා 2022 දෙසැම්බර් මස අනුමත ඉන්ධන සීමාව ඉක්මවා වැය කළ අමතර ඉන්ධන ලීටර් 53 සඳහා අනුමත කිරීම සඳහා නිර්දේශය ලබාදීම සුදුසු බව කමිටුව තීරණය කරන ලදී.

මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුතු කාර්මික නිලධාරී (පුහුණු) තනතුර සඳහා 2022.04.01 දින සිට පත්වීම ලද බී.එම්.හිරන්ත ලක්ෂාන් මයා විසින් 2022.12.29 දිනැති ඉල්ලීම් ලිපිය මගින් ක්ෂේත්‍ර රාජකාරි සඳහා ගෙවන සංයුක්ත දීමනාව ඔහුගේ පත්වීම් ලද දින සිට රු:5,000.00ක සීමාවකට යටත්ව හා පොදුවේ කාර්මික නිලධාරී (පුහුණ) තනතුරට අදාල සංයුක්ත දීමනාව ලෙස රු:5,000.00 ගෙවීමද තවද 2023/01/01 දින සිට ක්ෂේත්‍ර දීමනාව වැඩි කිරීම සඳහා අනුමත කිරීම සඳහා නිර්දේශය ලබාදීම සුදුසු බව කමිටුව තීරණය කරන ලදී.

වසර ගණනාවක් භාවිත නොකර අවට තිබෙන සභාව සතු ඉඩම් හඳුනා ගෙන සභාව සතු කර ගැනීම හා එම ඉඩම් බදු දීම සඳහා අනුමත කිරීම සඳහා නිර්දේශය ලබාදීම සුදුසු බව කමිටුව තීරණය කරන ලදී.

පරණ බස් නැවතුම්පෙලේහි පහල මහලේ එක් කුටියක් මාර්ගස්ථ ප්‍රවාහන අධිකාරියට ලබා දීම සඳහා අනුමත කිරීම සඳහා නිර්දේශය ලබාදීම සුදුසු බව කමිටුව තීරණය කරන ලදී.

මීගහකිවුල නගරයේ කඩ කාමර තක්සේරු දෙපාර්තුමේන්තුවෙන් තක්සේරු කරන තෙක් කඩ කුලී මුදල සංශෝධනය කිරීම සඳහා සභාව වෙත යොමු කිරීම සුදුසු බව කමිටුව තීරණය කරන ලදී.

දිනට නියමිත කරුණු අවසන් බැවින් හා සාකච්ඡා කිරීමට වෙනත් කාරණා නොමැති බැවින්, ගරු සභාපතිතුමාගේ ස්තූති කතාවෙන් අනතුරුව මුදල් හා ප්‍රතිපත්ති කමිටුව පෙ.ව.11.00ට අවසන් කරන ලදී.

මුලාසනය සභාව අමතමින්, මීළගට න්‍යාය පත්‍රානුකූලව 2022 දෙසැම්බර් මස ආදායම්,වියදම් වාර්තා හා සභාවේ වාහන සඳහා ඉන්ධන භාවිතය පිළිබඳ වාර්තා සභාවට ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලදී.

## මාසික ලැබීම් සාරාංශය

## මීගහකිවුල ප්‍රාදේශීය සභාව

මාසය - **2022** දෙසැම්බර්

| ආදායම් ශීර්ෂය | ආදායම් ප්‍රභවය | මුදල (රු) |
|---|---|---|
| 1/71 | වැටුප් ප්‍රතිපූර්ණය | 2,016,280. |
| 1/13 | ව්‍යාපාර බදු | 2,400 |
| 1/62 | පෝරම ගාස්තු | 595.0 |
| 1/64 | සේවක ණය පොළී | 47. |
| 1/41 | සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම | 10,000.0 |
| 1/44 | වීථි රේඛා හා නොපවරා ගැනීමේ සහතික නිකුත් කිරීම | 2,750.0 |
| 1/47 | වාහන නවතා තැබීමේ ගාස්තු | 11,300.0 |
| 1 | සේවක ණය | 2,711. |
| 1තැම්පත් | (ඩබ්.එම්. තිලකාවති මහත්මියගේ රාජ්‍ය සේවක අර්ථ සාධක අරමුදල් ලැබීම) | 353,581.5 |
| 2/23 | පොදු පහසුනා මධ්‍යස්ථානය | 13,000.0 |
| 2/31 | බලපත්‍ර ගාස්තු | 1,000.0 |
| 2/62 | පෝරම ගාස්තු | 10. |
| 2 | තැන්පත් (වෙළඳ බලපත්‍ර) | 100.0 |
| 3/22 | තාවකාලික කඩ ලැබීම | 5,250.0 |
| 3/21 | සභාව සතු ඉඩම් හා කුළී ((තල්දෙන උප තැපැල් කාර්යාලය) | 1,200.0 |
| 3/23 | ටෙන්ඩර් කඩ කුලී | 65,100.0 |
| 3තැම්පත් | LDSP ව්‍යාපෘතියෙහි කොහාන,වැවතැන්න මාර්ගයට අදාල අත රැදවුම් මුදල LDSP ගිණුමේ සිට සභා තැම්පත් ගිණුම වෙත මාරු කිරීම. | 192,255.8 |
| 4/14 | ජල ලැබීම | 76,975.0 |
| 6/15 | සභාව සතු ඉඩම් හා කුළී (පිටමාරුව පුංචි ලෝකාන්තය) | 10,000.0 |
| 6/52 | පුස්තකාල දඩ | 1,290.0 |

| | | |
|---|---|---|
| 6/62 | අබලි ද්‍රව්‍ය විකිණීම /පුස්තකාල පෝරම ගාස්තු/පෙර පාසල් අයදුම්පත් ගාස්තු | 2,550.00 |
| 6 | තැන්පත් (පුස්තකාල තැන්පත් ගාස්තු) | 200.00 |
| 5/23 | සතිපොළ ගාස්තු ලැබීම් | 169,080.00 |
| 173 | අත්තිකාරම් පියවීම | 109,848.00 |
| | වාහන හා යන්ත්‍රෝපකරණ කුලියට දීම | |
| 1/45 | ට්‍රැක්ටරය කුළියට දීම | 11,500.00 |
| 1/46 | බවුසරය කුලියට දීම | 8,000.00 |
| 3/43 | ටොන් 2 ගල්රෝල කුලියට දීම | 22,550.00 |
| 3/43 | ටොන් 8 ගල්රෝල කුලියට දීම | 536,400.00 |
| | එකතුව | 3,625,974.87 |

## 2022 දෙසැම්බර් මස ගෙවීම් විස්තරය - මීගහකිවුල ප්‍රාදේශීය සභාව

| අනු අංකය | ගෙවන ලද දිනය | ගෙවීම්ලාභී නම හා විස්තරය | මුදල (රු) |
|---|---|---|---|
| 1 | 2022.12.01 | ඩී.එම්.ආර්.යු.දිසානායක මයා, ලංකා ඉන්ධන පිරවුම්හල, 14 කණුව, මීගහකිවුල - අප සභාව සතු රථ වාහන සඳහා 2022 නොවැම්බර් මස 01 සිට 15 දක්වා ඉන්ධන සඳහා මුදල් ගෙවීම. | 287,190.00 |
| 2 | 2022.12.01 | ලංකාවේ සීමා සහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම - 2023 වර්ෂයේ අයවැය කෙටුම්පත් ලේඛණය පරීක්ෂා කර බැලීම වෙනුවෙන් මහජනතාව වෙත කරනු ලැබූ දැනුම් දීම පුවත්පත් වල පළ කිරීම වෙනුවෙන් ගෙවීම් කිරීම. | 36,570.00 |
| 3 | 2022.12.01 | කළමනාකරු, තච්චු පොත්හල, මීගහකිවුල - මීගහකිවුල, කළුගහකඳුර, පිටමාරුව පුස්තකාල සඳහා සැප්තැම්බර් මස පුවත්පත් බිල්පත් පියවීම. | 15,810.00 |
| 4 | 2022.12.01 | ආදායම් ගණකාධිකාරී(ඌව), ලංකා විදුලිබල මණ්ඩලය, අංක 04, ස්ප්‍රිංවැලි පාර, හිඳගොඩ - මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු 2022 සැප්තැම්බර් මස පිටමාරුව මහජන පුස්තකාලය විදුලි බිල්පත් පියවීම. | 360.00 |
| 5 | 2022.12.01 | ආදායම් ගණකාධිකාරී(ඌව), ලංකා විදුලිබල මණ්ඩලය, අංක 04, ස්ප්‍රිංවැලි පාර, හිඳගොඩ - මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු 2022 සැප්තැම්බර් මස නව කාර්යාලයේ විදුලි බිල්පත් පියවීම. | 9,964.80 |
| 6 | 2022.12.01 | ආදායම් ගණකාධිකාරී(ඌව), ලංකා විදුලිබල මණ්ඩලය, අංක 04, ස්ප්‍රිංවැලි පාර, හිඳගොඩ - මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු 2022 සැප්තැම්බර් මස මීගහකිවුල ජල පොම්පාගාරයේ විදුලි බිල්පත් පියවීම. | 17,300.00 |
| 7 | 2022.12.01 | ආදායම් ගණකාධිකාරී(ඌව), ලංකා විදුලිබල මණ්ඩලය, අංක 04, ස්ප්‍රිංවැලි පාර, හිඳගොඩ - මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු 2022 සැප්තැම්බර් මස තල්දෙන ජල පොම්පාගාරයේ විදුලි බිල්පත් පියවීම. | 1,702.57 |
| 8 | 2022.12.01 | ආදායම් ගණකාධිකාරී(ඌව), ලංකා විදුලිබල මණ්ඩලය, අංක 04, ස්ප්‍රිංවැලි පාර, හිඳගොඩ - මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු 2022 සැප්තැම්බර් මස පැරණි කාර්යාලයේ විදුලි බිල්පත් පියවීම. | 1,010.00 |
| 9 | 2022.12.01 | ආදායම් ගණකාධිකාරී(ඌව), ලංකා විදුලිබල මණ්ඩලය, අංක 04, ස්ප්‍රිංවැලි පාර, හිඳගොඩ - මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු 2022 ඔක්තෝම්බර් මස වීදි ලාම්පු විදුලි බිල්පත් පියවීම. | 3,460.00 |
| 10 | 2022.12.01 | සහකාර වාණිජ්‍ය අධිකාරී, ශ්‍රී ලංකා ටෙලිකොම්, බදුල්ල - මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු 055-2245890 දුරකතන බිල්පත් පියවීම 2022 සැප්තැම්බර් මස. | 3,232.16 |
| 11 | 2022.12.01 | සහකාර වාණිජ්‍ය අධිකාරී, ශ්‍රී ලංකා ටෙලිකොම්, බදුල්ල - මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු 055-2245775 දුරකතන බිල්පත් පියවීම 2022 සැප්තැම්බර් මස. | 1,309.70 |
| 12 | 2022.12.01 | කළමනාකරු, අසිත හාඩ්වෙයාර්, අංක 14, කාර්මික පෙදෙස, හෙලබොජුන් හල ඉදිරිපිට, මහියංගණය - මීගහකිවුල ජල යෝජනා ක්‍රමයේ ජල පොම්පාගාරය අසල ඇති නල ලිදේ නල ලිං පොම්පය අලුත්වැඩියා කිරීම සඳහා ගිය වියදම් පියවීම. | 7,500.00 |
| 13 | 2022.12.01 | ඒ.එන්.පී.දිසානායක, ආණ්ඩුකාරවර කාර්යාලය - ආණ්ඩුකාරවරතුමාගේ උපදෙස් පරිදි මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමා සමඟ කොළඹ රාජකාරි සඳහා 2022 නොවැම්බර් මස 22 සිට 24 වන දින අතිකාල දීමනා ගෙවීම. | 4,388.00 |
| 14 | 2022.12.01 | ඒ.එන්.පී.දිසානායක, ආණ්ඩුකාරවර කාර්යාලය - ආණ්ඩුකාරවරතුමාගේ උපදෙස් පරිදි මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමා සමඟ කොළඹ රාජකාරි සඳහා 2022 නොවැම්බර් මස 22 සිට 24 වන දින ගමන් වියදම් ගෙවීම. | 2,800.00 |
| 15 | 2022.12.01 | ඒ.එන්.පී.දිසානායක, ආණ්ඩුකාරවර කාර්යාලය - ආණ්ඩුකාරවරතුමාගේ උපදෙස් පරිදි මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමා සමඟ කොළඹ රාජකාරි සඳහා 2022 නොවැම්බර් මස 08 සිට 10 වන දින අතිකාල දීමනා ගෙවීම. | 3,291.00 |

| | | | | |
|---|---|---|---|---|
| 16 | 2022.12.01 | ජ්.එන්.පී.දිසානායක, ආණ්ඩුකාරවර කාර්යාලය - ආණ්ඩුකාරවරතුමාගේ උපදෙස් පරිදි මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමා සමඟ කොළඹ රාජකාරි සඳහා 2022 නොවැම්බර් මස 08 සිට 10 වන දින ගමන් වියදම් ගෙවීම. | | 1,750 |
| 17 | 2022.12.01 | ආර්.එම්.ලක්ෂ්මන් ජයසිරි, කාර්මික නිලධාරි, ප්‍රාදේශීය සභාව, මීගහකිවුල - කාර්මික නිලධාරි නිළ මුද්‍රාව සැකසීම වෙනුවෙන් අතින් දරණ ලද වියදම් පියවීම. | | 2,200 |
| 18 | 2022.12.01 | ආර්.එම්.ටී.සඳරුවන් මයා, මහජන සෞඛ්‍ය පරීක්ෂක, තල්දෙන - 2022 වර්ෂයේ ආහාර සාම්පල් පරීක්ෂාව සඳහා වැය වූ මුදල් ලබා දීම වෙනුවෙන් ගෙවීම කිරීම. | | 2,038 |
| 19 | 2022.12.01 | ආර්.එම්.ටී.ඩී.නිශ්ශංක මයා, මහජන සෞඛ්‍ය පරීක්ෂක, මීගහකිවුල - 2022 වර්ෂයේ ආහාර සාම්පල් පරීක්ෂාව සඳහා වැය වූ මුදල් ලබා දීම වෙනුවෙන් ගෙවීම කිරීම. | | 3,145 |
| 20 | 2022.12.01 | සභා ලේකම්, ප්‍රාදේශීය සභාව, මීගහකිවුල - 2022 නොවැම්බර් මස මුදල් හා ප්‍රතිපත්ති කමිටු දීමා ගෙවීම. | | 2,500 |
| 21 | 2022.12.08 | ජේ.එම්.ජේ.කුමාරසිරි, රියදුරු - අප සභාව සතු RD-9389 ට්‍රැක්ටර් රථයේ ටයරයට අවශ්‍ය ටියුබ් 01ක් ලබා ගැනීම වෙනුවෙන් අත්න් දරන ලද වියදම් ගෙවීම.(2022/09/17) | | 4,900 |
| 22 | 2022.12.08 | ජේ.එම්.ජේ.කුමාරසිරි, රියදුරු - අප සභාව සතු RD-9389 ට්‍රැක්ටර් රථයට නව ටියුබ් 01ක් ලබා ගැනීම වෙනුවෙන් අත්න් දරන ලද වියදම් ගෙවීම.(2022/10/21) | | 4,900 |
| 23 | 2022.12.08 | ජේ.එම්.අමාලි ජීවන්තිකා ජයසිංහ, පුස්තකාල සහයක - පුස්තකාල සේවා මණ්ඩලයේ සම්මන්ත්‍රණය සඳහා බදුල්ල පුස්තකාල සේවා මණ්ඩල ශ්‍රවණාගාරය වෙත යාම වෙනුවෙන් 2022 ඔක්තෝම්බර් මස 07 වන දින ගමන් වියදම් ගෙවීම. | | 1,026 |
| 24 | 2022.12.08 | ජේ.එම්.අමාලි ජීවන්තිකා ජයසිංහ, පුස්තකාල සහයක - මහජන පුස්තකාලයේ වාර්ෂික සැලසුම සැකසීම සඳහා බදුල්ල පුස්තකාල සේවා මණ්ඩල ශ්‍රවණාගාරය වෙත යාම වෙනුවෙන් 2022 නොවැම්බර් මස 03 වන දින ගමන් වියදම් ගෙවීම. | | 1,02 |
| 25 | 2022.12.08 | ජේ.එම්.අමාලි ජීවන්තිකා ජයසිංහ, පුස්තකාල සහයක - පාසල් කියවීමේ කඳවුරු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ වැඩසටහන සඳහා බදුල්ල පුස්තකාල සේවා මණ්ඩල ශ්‍රවණාගාරය වෙත යාම වෙනුවෙන් 2022 නොවැම්බර් මස 28 වන දින ගමන් වියදම් ගෙවීම. | | 1,02 |
| 26 | 2022.12.08 | ජේ.එම්.අමාලි ජීවන්තිකා ජයසිංහ, පුස්තකාල සහයක - පළාත් පාලන පුස්තකාල ඵලදායිතා සම්මාන ප්‍රදානෝත්සවය සඳහා බදුල්ල පුස්තකාල සේවා මණ්ඩල ශ්‍රවණාගාරය වෙත යාම වෙනුවෙන් 2022 නොවැම්බර් මස 30 වන දින ගමන් වියදම් ගෙවීම. | | 1,02 |
| 27 | 2022.12.08 | එස්.එම්.එන්.දිලිනි,සංවර්ධන නිලධාරි - 2022/09/02 කත්සේරු වාර්තාව ලබා දීම සඳහා පැමිණි නිලධාරීන්ට සංග්‍රහ වියදම් පියවීම.. | | 2,080 |
| 28 | 2022.12.08 | ඩී.එම්.කීර්ති උපනන්ද, ප්‍රාදේශීය සභාව, මීගහකිවුල - කලාවතැන්න කසල ව්‍යාපෘතිය ආරම්භ කිරීම සඳහා නිරීක්ෂණ චාරිකාව වෙනුවෙන් පැමිණි නිලධාරි මහත්මීන් හට සංග්‍රහ කිරීම සඳහා ගිය වියදම් පියවීම. | | 1,1 |
| 29 | 2022.12.08 | සභා ලේකම්, ප්‍රාදේශීය සභාව, මීගහකිවුල - සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූර්ණය කිරීම. | | 4,9 |
| 30 | 2022.12.08 | කළමනාකරු, MSN IT Solutions, 287/4, පහළ වීදිය, බදුල්ල - මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ DELL වර්ගයේ පරිගණක යන්ත්‍රය අළුත්වැඩියා කටයුතු කිරීම වෙනුවෙන් ගෙවීම. | | 3,5 |
| 31 | 2022.12.08 | කළමනාකරු, MSN IT Solutions, 287/4, පහළ වීදිය, බදුල්ල - මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ කාර්යාලයේ භාවිතා කරන Jolimark වර්ගයේ මුද්‍රණ යන්ත්‍රය අළුත්වැඩියා කටයුතු කිරීම වෙනුවෙන් ගෙවීම. | | 3, |
| 32 | 2022.12.08 | කළමනාකරු, රත්න සුපර් සිටි, මීගහකිවුල - මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු පොදු පහසුකා මධ්‍යස්ථානයට අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම වෙනුවෙන් මළ ගණන් පියවීම. | | 4,4 |
| 33 | 2022.12.08 | ඒ.ඩබ්.රෝහණ ජයසිංහ මයා, තෙල්දෙණියේ ගෙදර, කිවුල, මීගහකිවුල - 2023 වර්ෂය සඳහා මීගහකිවුල සතිපොළ ටෙන්ඩර් දීම වෙනුවෙන් ආපසු ගෙවන තැන්පතු මුදල නිදහස් කිරීම. | | 60, |
| 34 | 2022.12.08 | කේ.වී.ඩී.රෝහණ - 2022 පෙබරවාරි මස කැබ් රථයේ රාජකාරි කටයුතු වල නිරත වී ඇති බැවින් දෛනික වැටුප් ගෙවීම | | 14, |
| 35 | 2022.12.08 | ඩබ්.කේ.එච්.නුවන්, 2022 සැප්තැම්බර් මස පුංචි ලෝකාන්තයේ මුරකරු/මුදල් අයකැමි ලෙස සේවය කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම. | | 4, |
| 36 | 2022.12.08 | ඩබ්.කේ.එච්.නුවන්, 2022 ඔක්තෝම්බර් මස පුංචි ලෝකාන්තයේ මුරකරු/මුදල් අයකැමි ලෙස සේවය කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම. | | 18. |
| 37 | 2022.12.08 | ඒ.එම්.විජිත ප්‍රියන්ත මයා, රියදුරු - ගරු සභාපතිතුමා සමඟ පාලත තුල හා කොළඹ රාජකාරි යාම වෙනුවෙන් 2022 නොවැම්බර් මස අතිකාල දීමනා ගෙවීම. | | 10 |
| 38 | 2022.12.08 | පෝස්ට් මාස්ටර් ජනරාල්ගේ මහජන බැංකුවේ ගිණුම් අංක 010100179027344 ගිණුමට බැර - නිදහස් තැපැල් මුද්දර ගාස්තු අවසන් බැවින් ඉදිරියට අවශ්‍ය වන මුද්දර ලබා ගැනීම වෙනුවෙන් ගෙවීම කිරීම. | | 5 |
| 39 | 2022.12.12 | කොන්ත්‍රාත් පදනමින් බඳවා ගන්නා ලද යන්ත්‍ර සහයක සහ යන්ත්‍ර ක්‍රියාකරු වැටුප් ගෙවීම 2022 නොවැම්බර් මස | | 69,020. |
| 40 | 2022.12.12 | ආදේශක වැටුප් 2022 නොවැම්බර් මස වැටුප් ගෙවීම. | | 71,822. |

| | | | |
|---|---|---|---|
| 41 | 2022.12.12 | කළමනාකරු,ඉමාෂා ගරාජ්, අරාව පාර, ඉලුක්පිටිය - වල් කපන යන්ත්‍රයේ අලුත්වැඩියාව වෙනුවෙන් ගෙවීම් සිදු කිරීම. | 1,700.00 |
| 42 | 2022.12.12 | සභා ලේකම්, ප්‍රාදේශීය සභාව, මීගහකිවුල - 2022/12/13 දින පැවැත්වෙන මහ සභාවට සංග්‍රහ වියදම් දැරීම වෙනුවෙන් අත්තිකාරම් මුදලක් ලබා ගැනීම. | 5,000.00 |
| 43 | 2022.12.12 | සභා ලේකම්, ප්‍රාදේශීය සභාව, මීගහකිවුල - 2022 දෙසැම්බර් මස මුදල් හා ප්‍රතිපත්ති කමිටු දීමා ගෙවීම. | 2,500.00 |
| 44 | 2022.12.12 | ඩී.එම්.ලහිරු සඳරුවන්, කළමනාකරණ සේවා නිලධාරි - පුහුණු වැඩමුළුව සඳහා පැල්ගහතැන්න පුහුණු මධ්‍යස්ථානය වෙත යාම වෙනුවෙන් 2022 දෙසැම්බර් මස ගමන් වියදම් ගෙවීම. | 1,266.00 |
| 45 | 2022.12.13 | ඩබ්.එම්.තිලකාවතී මිය, පිටමාරුව - පිටමාරුව පුස්තකාලයේ පුස්තකාල සහයක ලෙස සේවය කල කාල සීමාව සඳහා රාජ්‍ය සේවා අර්ථ සාධක දායක මුදල් ගෙවීම. | 353,581.51 |
| 46 | 2022.12.13 | ඩබ්.එම්.තිලකාවතී මිය, පුස්තකාල සහයක - 2014.10.24 සිට 2014.12.31 දක්වා වූ හිඟ වැටුප් ගෙවීම. | 47,950.87 |
| 47 | 2022.12.13 | මන්ත්‍රී දීමනා 2022 දෙසැම්බර් මස | 294,000.00 |
| 48 | 2022.12.14 | ඩී.එම්.සංජීව නුවන්(ආදේශක) රියදුරු - 2022 නොවැම්බර් මස කාර්යාලයේ සේවය කිරීම වෙනුවෙන් ගෙවීම. | 22,229.82 |
| 49 | 2022.12.14 | ආර්.එම්.මදූසිකා රත්නායක මිය, සංවර්ධන නිලධාරි - අවසන් ගිණුම් හා වාර්ෂික වාර්තා සැදීම පිළිබඳ පුහුණු වැඩසටහන සඳහා පැල්ගහතැන්න පුහුණු මධ්‍යස්ථානයට යාම වෙනුවෙන් 2022 දෙසැම්බර් මස ගමන් වියදම් ගෙවීම. | 1,280.00 |
| 50 | 2022.12.14 | ආර්.එම්.නිල්මිණි සකුන්තලා මිය, කළමනාකරණ සේවා නිලධාරි - අවසන් ගිණුම් හා වාර්ෂික වාර්තා සැදීම පිළිබඳ පුහුණු වැඩසටහන සඳහා පැල්ගහතැන්න පුහුණු මධ්‍යස්ථානයට යාම වෙනුවෙන් 2022 දෙසැම්බර් මස ගමන් වියදම් ගෙවීම. | 1,280.00 |
| 51 | 2022.12.14 | වයි.එම්.නුවන් හර්ෂණ මයා, රියදුරු - කාර්යාල රාජකාරි සඳහා යාම වෙනුවෙන් 2022 නොවැම්බර් මස ගමන් වියදම් ගෙවීම. | 5,600.00 |
| 52 | 2022.12.19 | ඩී.එම්.ආර්.යූ.දිසානායක මයා, ලංකා ඉන්ධන පිරවුම්හල, 14 කණුව, මීගහකිවුල - අප සභාව සතු රථ වාහන සඳහා 2022 නොවැම්බර් මස 16 සිට 30 දක්වා ඉන්ධන සඳහා මුදල් ගෙවීම. | 344,470.00 |
| 53 | 2022.12.19 | කළමනාකරු, තවිදු පොත්හල, මීගහකිවුල - මීගහකිවුල, කළුගහකඳුර, පිටමාරුව පුස්තකාල සඳහා ඔක්තෝම්බර් මස පුවත්පත් බිල්පත් පියවීම. | 17,600.00 |
| 54 | 2022.12.20 | සී/ස ඌව පළාත් සමුපකාර ග්‍රාමීය බැංකු සංගමය, බදුල්ල - A4 පැකට් 20 හා නිල් පෑන් 100 මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම. | 54,500.00 |
| 55 | 2022.12.20 | එස්.එම්.එල්.එච්.ජයවර්ධන මැතිතුමා, ගරු සභාපති - පාලත තුල හා කොළඹ රාජකාරියට යැම වෙනුවෙන් 2022 දෙසැම්බර් මස ගමන් වියදම් ගෙවීම. | 19,000.00 |
| 56 | 2022.12.20 | ඒ.එම්.විජිත ප්‍රියන්ත මයා, රියදුරු - ගරු සභාපතිතුමා සමඟ පාලත තුල හා කොළඹ රාජකාරියට යැම වෙනුවෙන් 2022 දෙසැම්බර් මස ගමන් වියදම් ගෙවීම. | 7,350.00 |
| 57 | 2022.12.20 | ඒ.එම්.විජිත ප්‍රියන්ත මයා, රියදුරු - ගරු සභාපතිතුමා සමඟ පාලත තුල හා කොළඹ රාජකාරියට යැම වෙනුවෙන් 2022 දෙසැම්බර් මස අතිකාල දීමනා ගෙවීම. | 10,296.00 |
| 58 | 2022.12.20 | ටී.එම්.ඩී.එම්.කුමාරිහාමි මිය, සංවර්ධන නිලධාරි - සමාජ හා පරිසර ආරක්ෂණ වැඩසටහන සඳහා බදුල්ල ප්‍රාදේශීය සභාව වෙත යාම වෙනුවෙන් 2022/12/02 දින සඳහා ගමන් වියදම් ගෙවීම. | 1,100.00 |
| 59 | 2022.12.20 | ටී.එම්.ඩී.එම්.කුමාරිහාමි මිය, සංවර්ධන නිලධාරි - 2021 සංඛ්‍යාත දත්ත පත්‍රිකාව සකස් කිරීමේ රැස්වීම සඳහා ඌව පළාත් සභා පර්සි සමරවීර සම්මන්ත්‍රණ ශාලාව වෙත යාම වෙනුවෙන් 2022/12/12 දින සඳහා ගමන් වියදම් ගෙවීම. | 670.00 |
| 60 | 2022.12.20 | කේ.තරිඳු දර්ශන ප්‍රියකැළුම්, කළමනාකරණ සේවා නිලධාරි - පුංචිලෝකාන්ත සාකාච්ඡාව හා LAPDP සැකසීම සඳහා ආණ්ඩුකාර කාර්යාලය හා පළාත් සභා ශ්‍රවණාගාරය වෙත 2022 සැප්තැම්බර් මස ගමන් වියදම් ගෙවීම. | 2,052.00 |
| 61 | 2022.12.20 | කේ.තරිඳු දර්ශන ප්‍රියකැළුම්, කළමනාකරණ සේවා නිලධාරි - LDSP පුහුණු වැජමුළුව සඳහා පැල්ගහතැන්න පුහුණු මධ්‍යස්ථානය වෙත 2022 ඔක්තෝම්බර් මස ගමන් වියදම් ගෙවීම. | 1,266.00 |
| 62 | 2022.12.20 | කේ.තරිඳු දර්ශන ප්‍රියකැළුම්, කළමනාකරණ සේවා නිලධාරි - LDSP(ESMP) සැකසීම පිළිබඳ වැඩමුළුව සඳහා බදුල්ල ප්‍රාදේශීය සභා ශ්‍රවණාගාරය වෙත 2022 නොවැම්බර් මස ගමන් වියදම් ගෙවීම. | 1,160.00 |
| 63 | 2022.12.20 | කේ.තරිඳු දර්ශන ප්‍රියකැළුම්, කළමනාකරණ සේවා නිලධාරි - පරිසන ආරක්ෂණ හා LDSP වැඩමුළුව සඳහා පැල්ගහතැන්න පුහුණු මධස්ථානය හා බදුල්ල ප්‍රාදේශීය සබා ශ්‍රවණාගාරය වෙත 2022 දෙසැම්බර් මස ගමන් වියදම් ගෙවීම. | 3,476.00 |
| 64 | 2022.12.20 | එස්.ජේ.එම්.රූපසිංහ මයා,රියදුරු - කාර්යාල රාජකාරි සඳහා 2022 නොවැම්බර් මස ගමන් වියදම් ගෙවීම. | 5,600.00 |
| 65 | 2022.12.23 | පෝස්ට් මාස්ටර් ජනරාල්ගේ මහජන බැංකුවේ ගිණුම් අංක 010100179027344 ගිණුමට බැර - නිදහස් තැපැල් මුද්දර ගාස්තු අවසන් බැවින් ඉදිරියට අවශ්‍ය වන මුද්දර ලබා ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම. | 5,000.00 |
| 66 | 2022.12.23 | කාර්ය මණ්ඩල වැටුප් ගෙවීම 2022 දෙසැම්බර් මස | 1,923,845.04 |

| | | | |
|---|---|---|---|
| 67 | 2022.12.23 | නව අභ්‍යාසලාභී උපාධිධාරී වැටුප් - 2022 දෙසැම්බර් මස එස්.එම්.නවෝදා දිලිනි මෙයගේ වැටුප් ගෙවීම. | 43,625.60 |
| 68 | 2022.12.23 | කළමනාකරු, සහන් ටයර් හවුස්, පස්සර පාර, බදුල්ල - අප සභාව සතු 252-6368 කැබ් රථයට බැටරිය යෙදීම වෙනුවෙන් ගෙවීම සිදු කිරීම. | 65,000.00 |
| 69 | 2022.12.29 | ඩබ්.කේ.එච්.නුවන් - 2022 නොවැම්බර් මස පුංචි ලෝකාන්තයට අදාළ සේවයේ නිරත වීම වෙනුවෙන් දෛනික වැටුප් ගෙවීම. | 14,819.96 |
| 70 | 2022.12.29 | එස්.ජේ.එම්.රූපසිංහ මයා,රියදුරු - 54-6565 කැබ් රථයේ විදුලි පන්දම් පද්ධතිය අලුත්වැඩියා සඳහා අතින් දරණ ලද මුදල් ගෙවීම. | 1,000.00 |
| 71 | 2022.12.29 | කළමනාකරු, වික්‍රම ටයර් හවුස්,නුවර පාර, මීගහකිවුල - අප සභාව සතු RD-9389 ට්‍රැක්ටර් රථය සඳහා අවශ්‍ය හයිඩ්‍රොලික් ලීටර් 03 මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම සිදු කිරීම. | 4,500.00 |
| 72 | 2022.12.30 | ඩී.එම්.ආර්.යූ.දිසානායක මයා, ලංකා ඉන්ධන පිරවුම්හල, 14 කණුව, මීගහකිවුල - අප සභාව සතු රථ වාහන සඳහා 2022 දෙසැම්බර් මස 01 සිට 15 දක්වා ඉන්ධන සඳහා මුදල් ගෙවීම. | 287,500.00 |
| 73 | 2022.12.30 | කළමනාකරු, හේෂාන් ඉන්ජිනියරින් වර්ක්ස්, 16 කණුව, ඉමකදුර, මීගහකිවුල - මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු YTS ටොන් 08 රෝලේහි මෝටර් පොම්පය ගලවා නැවත අලුතින් පොම්පය සවි කිරීම වෙනුවෙන් ගෙවීම කිරීම. | 49,600.00 |
| 74 | 2022.12.30 | රාජක්‍රිෂ්ණන් තනලෙච්චමි, රෝබේරිය - 2022 ජූලි,ආගෝස්තු, සැප්තැම්බර්, ඔක්තෝම්බර්, නොවැම්බර් මස වල මහා සභා වාර්තා දෙමළ භාෂාවට පරිවර්තනය කිරීම වෙනුවෙන් ගෙවීම. | 25,000.00 |
| 75 | 2022.12.30 | ආර්.එම්.ලක්ෂ්මන් ජයසිරි, කාර්මික නිලධාරි, ප්‍රාදේශීය සභාව, මීගහකිවුල - 2022 ඔක්තෝම්බර් මස 15,29 දින නිවාඩු දින වැටුප් ලබා ගැනීම. | 3,371.00 |
| 76 | 2022.12.30 | ආර්.එම්.ලක්ෂ්මන් ජයසිරි, කාර්මික නිලධාරි, ප්‍රාදේශීය සභාව, මීගහකිවුල - 2022 නොවැම්බර් මස 12,20 දින නිවාඩු දින වැටුප් ලබා ගැනීම. | 3,371.0 |
| 77 | 2022.12.30 | ආදායම් ගණකාධිකාරි(ඌව), ලංකා විදුලිබල මණ්ඩලය, අංක 04, ස්ප්‍රිංවැලි පාර, හිඳගොඩ - මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු 2022 ඔක්තෝම්බර් මස මීගහකිවුල ජල පොම්පාගාරයේ විදුලි බිල්පත් පියවීම. | 20,153.8 |
| 78 | 2022.12.30 | ආදායම් ගණකාධිකාරි(ඌව), ලංකා විදුලිබල මණ්ඩලය, අංක 04, ස්ප්‍රිංවැලි පාර, හිඳගොඩ - මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු 2022 ඔක්තෝම්බර් මස පැරණි කාර්යාලයේ විදුලි බිල්පත් පියවීම. | 1,010.2 |
| 79 | 2022.12.30 | ආදායම් ගණකාධිකාරි(ඌව), ලංකා විදුලිබල මණ්ඩලය, අංක 04, ස්ප්‍රිංවැලි පාර, හිඳගොඩ - මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු 2022 ඔක්තෝම්බර් මස මීගහකිවුල නව කාර්යාලයේ විදුලි බිල්පත් පියවීම. | 5,816.5 |
| 80 | 2022.12.30 | ආදායම් ගණකාධිකාරි(ඌව), ලංකා විදුලිබල මණ්ඩලය, අංක 04, ස්ප්‍රිංවැලි පාර, හිඳගොඩ - මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු 2022 ඔක්තෝම්බර් මස පිටමාරුව පුස්තකාලයේ විදුලි බිල්පත් පියවීම. | 410.0 |
| 81 | 2022.12.30 | ආදායම් ගණකාධිකාරි(ඌව), ලංකා විදුලිබල මණ්ඩලය, අංක 04, ස්ප්‍රිංවැලි පාර, හිඳගොඩ - මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු 2022 ඔක්තෝම්බර් මස වීදි ලාම්පු සඳහා විදුලි බිල්පත් පියවීම. | 2,541.9 |
| 82 | 2022.12.30 | සහකාර වාණිජ්‍ය අධිකාරි, ශ්‍රී ලංකා ටෙලිකොම්, බදුල්ල - මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු 055-2245775 දුරකතන බිල්පත් පියවීම 2022 ඔක්තෝම්බර් මස. | 1,176.6 |
| 83 | 2022.12.30 | සහකාර වාණිජ්‍ය අධිකාරි, ශ්‍රී ලංකා ටෙලිකොම්, බදුල්ල - මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු 055-2245890 දුරකතන බිල්පත් පියවීම 2022 ඔක්තෝම්බර් මස. | 3,613.3 |
| 84 | 2022.12.30 | කළමනාකරු,රත්න සුපර් සිටි, මීගහකිවුල - මීගහකිවුල - මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු කෝමාරික, කෙසෙල්වත්ත, වෙලන්ලන්ද, මීගහකිවුල, තල්දෙන ජල යෝජනා ක්‍රම සඳහා අලුත්වැඩියා කටයුතු වලට අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම වෙනුවෙන් මළ ගණන් පියවීම. | 46,980.0 |
| 85 | 2022.12.30 | කළමනාකරු,රත්න සුපර් සිටි, මීගහකිවුල - මීගහකිවුල - මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ කාර්යාලයේ පරිගණකයට විදුලිය ලබා ගැනීම සඳහා ද්‍රව්‍ය මිලදී ගැනීම වෙනුවෙන් මළ ගණන් පියවීම. | 1,045. |
| 86 | 2022.12.30 | රෙජිස්ට්‍රාර් ජනරාල්,ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලය,බදුල්ල - මුද්දර අප ලේඛණ පිලියෙල කිරීමේ ගාස්තු ගෙවීම වෙනුවෙන් 2022 ජනවාරි මස ජූනි මස දක්වා ගෙවීම. | 3,100. |
| 87 | 2022.12.30 | එස්.එම්.ඒකනායක බණ්ඩා, ආදායම් පරීක්ෂක(වැ.බ) - බදු මුදල් අය කිරීම සඳහා ක්ෂේත්‍රයට යාම වෙනුවෙන් 2022 සැප්තැම්බර් මස ගමන් වියදම් ගෙවීම. | 2,500. |
| 88 | 2022.12.30 | එස්.එම්.ඒකනායක බණ්ඩා, ආදායම් පරීක්ෂක(වැ.බ) - බදු මුදල් අය කිරීම සඳහා ක්ෂේත්‍රයට යාම වෙනුවෙන් 2022 ඔක්තෝම්බර් මස ගමන් වියදම් ගෙවීම. | 2,500 |
| 89 | 2022.12.30 | එස්.එම්.ඒකනායක බණ්ඩා, ආදායම් පරීක්ෂක(වැ.බ) - බදු මුදල් අය කිරීම සඳහා ක්ෂේත්‍රයට යාම වෙනුවෙන් 2022 නොවැම්බර් මස ගමන් වියදම් ගෙවීම. | 2,500 |
| 90 | 2022.12.30 | එස්.එම්.ඒකනායක බණ්ඩා, ආදායම් පරීක්ෂක(වැ.බ) - බදු මුදල් අය කිරීම සඳහා ක්ෂේත්‍රයට යාම වෙනුවෙන් 2022 දෙසැම්බර් මස ගමන් වියදම් ගෙවීම. | 2,500 |

| | | | |
|---|---|---|---|
| 91 | 2022.12.30 | ආර්.එම්.ටී.සඳරුවන් මයා, මහජන සෞඛ්‍ය පරීක්ෂක, තල්දෙන - 2022 ජූලි මස සෞඛ්‍ය සම්බන්ධ රාජකාරි කටයුතු සම්බන්ධයන් ගෙවීම් කිරීම. | 850.00 |
| 92 | 2022.12.30 | ආර්.එම්.ටී.සඳරුවන් මයා, මහජන සෞඛ්‍ය පරීක්ෂක, තල්දෙන - 2022 අගෝස්තු මස සෞඛ්‍ය සම්බන්ධ රාජකාරි කටයුතු සම්බන්ධයන් ගෙවීම් කිරීම. | 850.00 |
| 93 | 2022.12.30 | ආර්.එම්.ටී.සඳරුවන් මයා, මහජන සෞඛ්‍ය පරීක්ෂක, තල්දෙන - 2022 සැප්තැම්බර් මස සෞඛ්‍ය සම්බන්ධ රාජකාරි කටයුතු සම්බන්ධයන් ගෙවීම් කිරීම. | 1,000.00 |
| 94 | 2022.12.30 | ආර්.එම්.ටී.සඳරුවන් මයා, මහජන සෞඛ්‍ය පරීක්ෂක, තල්දෙන - 2022 ඔක්තෝම්බර් මස සෞඛ්‍ය සම්බන්ධ රාජකාරි කටයුතු සම්බන්ධයන් ගෙවීම් කිරීම. | 1,000.00 |
| 95 | 2022.12.30 | ආර්.එම්.ටී.සඳරුවන් මයා, මහජන සෞඛ්‍ය පරීක්ෂක, තල්දෙන - 2022 නොවැම්බර් මස ආහාර සම්පල් හා කඩ පරීක්ෂාව වෙනුවෙන් ගෙවීම් කිරීම. | 1,000.00 |
| 96 | 2022.12.30 | ආර්.එම්.ටී.සඳරුවන් මයා, මහජන සෞඛ්‍ය පරීක්ෂක, තල්දෙන - 2022 දෙසැම්බර් මස සෞඛ්‍ය සම්බන්ධ රාජකාරි කටයුතු සම්බන්ධයන් ගෙවීම් කිරීම. | 1,000.00 |
| 97 | 2022.12.30 | ආර්.එම්.තිමිර ධනංජ නිශ්ශංක මයා, මහජන සෞඛ්‍ය පරීක්ෂක, මීගහකිවුල - 2022 ජූනි මස පොළ හා කඩ පරීක්ෂා කිරීම වෙනුවෙන් ගෙවීම් කිරීම. | 850.00 |
| 98 | 2022.12.30 | ආර්.එම්.තිමිර ධනංජ නිශ්ශංක මයා, මහජන සෞඛ්‍ය පරීක්ෂක, මීගහකිවුල - 2022 ජූලි මස පොළ, කඩ හා ආහාර සාම්පල් පරීක්ෂා කිරීම වෙනුවෙන් ගෙවීම් කිරීම. | 850.00 |
| 99 | 2022.12.30 | ආර්.එම්.තිමිර ධනංජ නිශ්ශංක මයා, මහජන සෞඛ්‍ය පරීක්ෂක, මීගහකිවුල - 2022 අගෝස්තු මස ආහාර, කඩ හා පොළ පරීක්ෂා කිරීම වෙනුවෙන් ගෙවීම් කිරීම. | 850.00 |
| 100 | 2022.12.30 | ආර්.එම්.තිමිර ධනංජ නිශ්ශංක මයා, මහජන සෞඛ්‍ය පරීක්ෂක, මීගහකිවුල - 2022 සැප්තැම්බර් මස වෙළඳ බලපත්‍ර පරීක්ෂාව, ඩෙංගු හා කඩ පරීක්ෂා කිරීම වෙනුවෙන් ගෙවීම් කිරීම. | 1,000.00 |
| 101 | 2022.12.30 | ආර්.එම්.තිමිර ධනංජ නිශ්ශංක මයා, මහජන සෞඛ්‍ය පරීක්ෂක, මීගහකිවුල - 2022 ඔක්තෝම්බර් මස ආහාර සාම්පල් කඩ හා ඩෙංගු පරීක්ෂා කිරීම වෙනුවෙන් ගෙවීම් කිරීම. | 1,000.00 |
| 102 | 2022.12.30 | ආර්.එම්.තිමිර ධනංජ නිශ්ශංක මයා, මහජන සෞඛ්‍ය පරීක්ෂක, මීගහකිවුල - 2022 නොවැම්බර් මස හෝටල් හා කඩ, පොළ, වෙළඳ බලපත්‍ර ලබාදීමේ ක්ෂේත්‍ර පරීක්ෂණ වෙනුවෙන් ගෙවීම් කිරීම. | 1,000.00 |
| 103 | 2022.12.30 | ආර්.එම්.තිමිර ධනංජ නිශ්ශංක මයා, මහජන සෞඛ්‍ය පරීක්ෂක, මීගහකිවුල - 2022 දෙසැම්බර් මස ඩෙංගු, කඩ හා ආහාර සාම්පල් පරීක්ෂා කිරීම වෙනුවෙන් ගෙවීම් කිරීම. | 1,000.00 |
| 104 | 2022.12.30 | ඩී.එම්.ආර්.යූ.දිසානායක මයා, ලංකා ඉන්ධන පිරවුම්හල, 14 කණුව, මීගහකිවුල - අප සභාව සතු රථ වාහන සඳහා 2022 දෙසැම්බර් මස 16 සිට 30 දක්වා ඉන්ධන සඳහා මුදල් ගෙවීම. | 190,260.00 |
| 105 | 2022.12.30 | දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්, දේශීය ආදායම් කොමසාරිස් කාර්යාලය, මුද්දර බදු අංශය, කොළඹ 02 - 2022 වර්ෂයේ වෙළඳ බලපත්‍ර මුද්දර ගාස්තු තැම්පත් නිදහස් කිරීම වෙනුවෙන් ගෙවීම් කිරීම. | 27,325.00 |
| 106 | 2022.12.30 | කළමනාකරු, රත්න සුපර් සිටි, මීගහකිවුල - මීගහකිවුල ප්‍රාදේශීය සභාව විසින් නඩත්තු කරනු ලබන වීථි ලාම්පු අළුත්වැඩියා කටයුතු සඳහා මිලදී ගත් ද්‍රව්‍ය වෙනුවෙන් මිළ ගණන් පියවීම. | 52,865.00 |
| 107 | 2022.12.30 | ඩී.එම්.කේ.ඩී.දිසානායක මෙය, සභා ලේකම් - පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වීම වෙනුවෙන් 2022 සැප්තැම්බර් මස ගමන් වියදම් ගෙවීම. (2022.09.07-2022.09.28) | 1,600.00 |
| 108 | 2022.12.30 | ඩී.එම්.කේ.ඩී.දිසානායක මෙය, සභා ලේකම් - ප්‍රජා මණ්ඩල වැඩසටහන සඳහා රිවර් සයිඩ් හෝටලය වෙත යාම වෙනුවෙන් 2022 ඔක්තෝම්බර් මස ගමන් වියදම් ගෙවීම.(2022.10.06) | 800.00 |
| 109 | 2022.12.30 | ඩී.එම්.කේ.ඩී.දිසානායක මෙය, සභා ලේකම් - පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වීම වෙනුවෙන් 2022 නොවැම්බර් මස ගමන් වියදම් ගෙවීම.(2022.11.18/22/26) | 2,400.00 |
| 110 | 2022.12.30 | ඩී.එම්.කේ.ඩී.දිසානායක මෙය, සභා ලේකම් - පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වීම වෙනුවෙන් 2022 අගෝස්තු මස ගමන් වියදම් ගෙවීම.(2022.08.01/02/03/25) | 3,200.00 |
| 111 | 2022.12.30 | ඩී.එම්.කේ.ඩී.දිසානායක මෙය, සභා ලේකම් - පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වීම වෙනුවෙන් 2022 දෙසැම්බර් මස ගමන් වියදම් ගෙවීම.(2022.12.22/23) | 1,820.00 |
| 112 | 2022.12.30 | දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්, දේශීය ආදායම් කොමසාරිස් කාර්යාලය, මුද්දර බදු අංශය, කොළඹ 02 - 2022 ඔක්තෝම්බර්, නොවැම්බර්,දෙසැම්බර් මස වල කාර්ය මණ්ඩල වැටුපෙන් අය කල මුද්දර ගාස්තු යැවීම. | 3,450.00 |
| 113 | 2022.12.30 | ආර්.එම්.දුමින්ද ප්‍රියරාජ් මයා, සෞඛ්‍ය කම්කරු, ප්‍රාදේශීය සභාව, මීගහකිවුල - තල්දෙන සතිපොළ භූමියේ බැඳ තිබු දෙබරය කපා ඉවත් කිරීම වෙනුවෙන් ගෙවීම. | 2,000.00 |
| 114 | 2022.12.30 | එම්.කේ.දයාවංශ මයා, පිටමාරුව - 2022 ඔක්තෝම්බර්, නොවැම්බර්, දෙසැම්බර් මස වල පිටමාරුව සතිපොළ ශුද්ධ පවිත්‍ර කිරීම වෙනුවෙන් ගෙවීම | 6,500.00 |
| 115 | 2022.12.30 | ඩී.එම්.ජේමාවතී මිය, පිටමාරුව - 2022 ජූලි, ආගෝස්තු, සැප්තැම්බර්, ඔක්තෝම්බර්, නොවැම්බර්, දෙසැම්බර් මස වලට අදාල සතිපොළ බදු මුදල් එකතු කිරීමේ දීමනාව ගෙවීම. | 6,000.00 |
| 116 | 2022.12.30 | ඩී.එම්.ජේමාවතී මිය, පිටමාරුව - පිටමාරුව මහජන පුස්තකාලය සඳහා රබර් මුද්‍රාවක් සැකසීම වෙනුවෙන් අතින් දරන ලද මුදල් ගෙවීම. | 1,300.00 |

| | | | |
|---|---|---|---|
| 117 | 2022.12.30 | ආර්.එම්.ලක්ෂ්මන් ජයසිරි මයා, කාර්මික නිලධාරි - 2022 ඔක්තෝම්බර් මස සංයුක්ත දීමනා ගෙවීම | 5,000.00 |
| 118 | 2022.12.30 | ආර්.එම්.ලක්ෂ්මන් ජයසිරි මයා, කාර්මික නිලධාරි - 2022 නොවැම්බර් මස සංයුක්ත දීමනා ගෙවීම | 5,000.00 |
| 119 | 2022.12.30 | එම්.එස්.කේ.මහනායක මයා, ආදායම් පරීක්ෂක - බදු මුදල් අය කිරීම සඳහා ක්ෂේත්‍ර රාජකාරියට යාම වෙනුවෙන් 2022 මාර්තු මස ගමන් වියදම් ගෙවීම. | 2,500.00 |
| 120 | 2022.12.30 | එම්.එස්.කේ.මහනායක මයා, ආදායම් පරීක්ෂක - බදු මුදල් අය කිරීම සඳහා ක්ෂේත්‍ර රාජකාරියට යාම වෙනුවෙන් 2022 අප්‍රේල් මස ගමන් වියදම් ගෙවීම. | 2,500.00 |
| 121 | 2022.12.30 | එම්.එස්.කේ.මහනායක මයා, ආදායම් පරීක්ෂක - බදු මුදල් අය කිරීම සඳහා ක්ෂේත්‍ර රාජකාරියට යාම වෙනුවෙන් 2022 අගෝස්තු මස ගමන් වියදම් ගෙවීම. | 2,500.00 |
| 122 | 2022.12.30 | එම්.එස්.කේ.මහනායක මයා, ආදායම් පරීක්ෂක - බදු මුදල් අය කිරීම සඳහා ක්ෂේත්‍ර රාජකාරියට යාම වෙනුවෙන් 2022 සැප්තැම්බර් මස ගමන් වියදම් ගෙවීම. | 2,500.0 |
| 123 | 2022.12.30 | එම්.එස්.කේ.මහනායක මයා, ආදායම් පරීක්ෂක - බදු මුදල් අය කිරීම සඳහා ක්ෂේත්‍ර රාජකාරියට යාම වෙනුවෙන් 2022 ඔක්තෝම්බර් මස ගමන් වියදම් ගෙවීම. | 2,500.0 |
| 124 | 2022.12.30 | එම්.එස්.කේ.මහනායක මයා, ආදායම් පරීක්ෂක - බදු මුදල් අය කිරීම සඳහා ක්ෂේත්‍ර රාජකාරියට යාම වෙනුවෙන් 2022 නොවැම්බර් මස ගමන් වියදම් ගෙවීම. | 2,500.0 |
| 125 | 2022.12.30 | කේ.තරිඳු දර්ශන මයා, කළමනාකරණ සේවා නිලධාරී - වාර්ෂික ඒකාබද්ධ සැලැස්ම සකස් කිරීම සඳහා පැල්ගහතැන්න පුහුණු මධ්‍යස්ථානයට යාම වෙනුවෙන් 2022 දෙසැම්බර් මස ගමන් වියදම් ගෙවීම. | 1,270.0 |
| 126 | 2022.12.30 | ළහිරු සඳරුවන් මයා, කළමනාකරණ සේවා නිලධාරී - වාර්ෂික ඒකාබද්ධ සැලැස්ම සකස් කිරීම සඳහා පැල්ගහතැන්න පුහුණු මධ්‍යස්ථානයට යාම වෙනුවෙන් 2022 දෙසැම්බර් මස ගමන් වියදම් ගෙවීම. | 1,270.0 |
| | | මුළු එකතුව | **4,762,1** |

### මීගහකිවුල ප්‍රාදේශීය සභාව

### වාහන සඳහා ලබා ගත් ඉන්ධන බිල්පත් පියවීමේ සාරාංශය

### 2022 දෙසැම්බර් මාසය 01 වැනිදා සිට 30 වැනිදා දක්වා

**2022.12.30 දිනට ඉන්ධන වියදම ( රුපියල් ) 477,760.00**

බිල්පත සකස් වී ඇති ආකාරය

| අ/අං | වාහන විස්තරය | ඉන්ධන වියදම ( රුපියල්) | ඉන්ධන ප්‍රමාණය |
|---|---|---|---|
| 1 | UP PF 5485 කැබ් රථය | - | - |
| 2 | 252-6368 කැබ් රථය | 56,900.00 | 135 |
| 3 | UP PE 5483 | 156,660.00 | 373 |
| 4 | 54-6565 කැබ් රථය | 38,500.00 | 90 |
| 5 | UP LL 7774 කෘෂ කැබ් රථය | - | - |
| 6 | RD 6200 ට්‍රැක්ටර් රථය | 44,100.00 | 105 |
| 7 | RD 9389 ට්‍රැක්ටර් රථය | 58,800.00 | 140 |
| 8 | 270-1735 ට්‍රැක්ටර් රථය | - | - |
| 9 | YTS TON 02 ගල් රෝල | 4,200.00 | 10 |
| 10 | YTS TON 08 ගල් රෝල | 85,000.00 | 200 |
| 11 | වල් කපන යන්ත්‍රය | - | - |
| 12 | වල් කපන යන්ත්‍රය සඳහා 2T ඔයිල් | - | - |
| 13 | ZA 5003 බැකෝ ලෝඩරය | 33,600.00 | 80 |
| 14 | RX 1456 ජල මෝටරය | - | - |
| | මුළු ඉන්ධන වියදම ( රුපියල් ) | **477,760.00** | **1,133** |

භාවිතා කළ ඉන්ධන විස්තර සාරාංශය

| | |
|---|---|
| ගරු සභාපතිතුමන්ගේ රාජකාරි සඳහා කැබ් රථ වෙනුවෙන් ඉන්ධන ලීටර් | 453 |
| කාර්යාලීය රාජකාරි සඳහා කැබ් රථ වෙනුවෙන් ඉන්ධන ලීටර් | 145 |
| කාර්යාලීය අනෙකුත් වාහන සහ යන්ත්‍ර සඳහා ඉන්ධන ලීටර් | 535 |
| **2022.12.30 දිනට භාවිතා කළ මුළු ඉන්ධන ලීටර්** | **1,133** |

**2022 දෙසැම්බර් මාසය 01 වැනිදා සිට 30 වැනිදා දක්වා**

**UP PE 5483 කැබ් රථය**

| අනු අංකය | ඇණවුම් දිනය | ඇණවුම් අංකය | ඉන්ධන ප්‍රමාණය | ඒකක මිල ( රු) | මුළු වටිනාකම | කාරණය |
|---|---|---|---|---|---|---|
| 1 | 2022.12.08 | 758079 | 55 | 420.00 | 23,100.00 | ගරු සභාපතිතුමන්ගේ රාජකාරි සදහා 2022.12.07 දින ලබා ගත් ඉන්ධන සදහා ගෙවීම |
| 2 | 2022.12.12 | 758085 | 70 | 420.00 | 29,400.00 | ගරු සභාපතිතුමන්ගේ රාජකාරි සදහා 2022.12.10 දින ලබා ගත් ඉන්ධන සදහා ගෙවීම |
| 3 | 2022.12.16 | 758090 | 50 | 420.00 | 21,000.00 | ගරු සභාපතිතුමන්ගේ රාජකාරි සදහා 2022.12.15 දින ලබා ගත් ඉන්ධන සදහා ගෙවීම |
| 4 | 2022.12.20 | 758092 | 38 | 420.00 | 15,960.00 | ගරු සභාපතිතුමන්ගේ රාජකාරි සදහා 2022.12.19 දින ලබා ගත් ඉන්ධන සදහා ගෙවීම |
| 5 | 2022.12.22 | 758094 | 50 | 420.00 | 21,000.00 | ගරු සභාපතිතුමන්ගේ රාජකාරි සදහා |
| 6 | 2022.12.28 | 758095 | 20 | 420.00 | 8,400.00 | කාර්යාලීය රාජකාරි සදහා 2022.12.27 දින ලබා ගත් ඉන්ධන සදහා ගෙවීම |
| 7 | 2022.12.28 | 758096 | 60 | 420.00 | 25,200.00 | ගරු සභාපතිතුමන්ගේ රාජකාරි සදහා |
| 8 | 2022.12.30 | 758099 | 30 | 420.00 | 12,600.00 | ගරු සභාපතිතුමන්ගේ රාජකාරි සදහා |
| එකතුව | | | **373** | | **156,660.00** | |

**252-6368 කැබ් රථය**

| අනු අංකය | ඇණවුම් දිනය | ඇණවුම් අංකය | ඉන්ධන ප්‍රමාණය | ඒකක මිල ( රු) | මුළු වටිනාකම | කාරණය |
|---|---|---|---|---|---|---|
| 1 | 2022.12.06 | 383425 | 15 | 420.00 | 6,300.00 | කාර්යාලී රාජකාරි සදහා |
| 2 | 2022.12.08 | 758077 | 20 | 430.00 | 8,600.00 | 2022.12.02 දින ගරු සභාපතිතුමනගේ රාජකාරි සදහා ලබා ගත් ඉන්ධන සදහා ගෙවීම |
| 3 | 2022.12.08 | 758078 | 10 | 420.00 | 4,200.00 | 2022.12.07 දින ගරු සභාපතිතුමනගේ රාජකාරි සදහා ලබා ගත් ඉන්ධන වෙනුවෙන් ගෙවීම |
| 4 | 2022.12.08 | 758081 | 50 | 420.00 | 21,000.00 | කාර්යාලීය රාජකාරි |
| 5 | 2022.12.13 | 758086 | 20 | 420.00 | 8,400.00 | කාර්යාලීය රාජකාරි |
| 6 | 2022.12.20 | 758091 | 20 | 420.00 | 8,400.00 | කාර්යාලීය රාජකාරි |
| එකතුව | | | **135** | | **56,900.00** | |

**54-6565 කැබ් රථය**

| අනු අංකය | ඇණවුම් දිනය | ඇණවුම් අංකය | ඉන්ධන ප්‍රමාණය | | මුළු වටිනාකම | කාරණය |
|---|---|---|---|---|---|---|
| 1 | 2022.12.01 | 383419 | 30 | 430.00 | 12,900.00 | ගරු සභාපතිතුමන්ගේ රාජකාරි |
| 2 | 2022.12.08 | 758076 | 40 | 430.00 | 17,200.00 | ගරු සභාපතිතුමන්ගේ රාජකාරි සදහා 2022.12.01 ලබා ඉන්ධන සදහා ගෙවීම. |
| 3 | 2022.12.08 | 758080 | 20 | 420.00 | 8,400.00 | රථය පළාත් පානයට භාර දීම සදහා |
| එකතුව | | | **90** | | **38,500.00** | |

**2022 දෙසැම්බර් මාසය 01 වැනිදා සිට 30 වැනිදා දක්වා**

UP LL7774 කාෘ කැබ් රථය

| අනු අංකය | ඇණවුම් දිනය | ඇණවුම් අංකය | ඉන්ධන ප්‍රමාණය | ඒකක මිල ( රු) | මුළු වටිනාකම | කාරණය |
|---|---|---|---|---|---|---|
| 1 | | | | | - | |
| එකතුව | | | | | - | |

RD 6200 ට්‍රැක්ටර් රථය

| අනු අංකය | ඇණවුම් දිනය | ඇණවුම් අංකය | ඉන්ධන ප්‍රමාණය | ඒකක මිල ( රු) | මුළු වටිනාකම | කාරණය |
|---|---|---|---|---|---|---|
| 1 | 2022.12.09 | 758082 | 35 | 420.00 | 14700.00 | කසළ හා ජල බවුසරයේ රාජකාරි |
| 2 | 2022.12.14 | 758288 | 35 | 420.00 | 14700.00 | කසළ හා ජල බවුසරයේ රාජකාරි |
| 3 | 2022.12.30 | 758098 | 35 | 420.00 | 14700.00 | කසළ හා ජල බවුසරයේ රාජකාරි |
| එකතුව | | | **105** | | **44100.00** | |

RD 9389 ට්‍රැක්ටර් රථය

| අනු අංකය | ඇණවුම් දිනය | ඇණවුම් අංකය | ඉන්ධන ප්‍රමාණය | ඒකක මිල ( රු) | මුළු වටිනාකම | කාරණය |
|---|---|---|---|---|---|---|
| 1 | 2022.12.06 | 383424 | 35 | 420.00 | 14,700.00 | කසළ ප්‍රවාහනය |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 2 | 2022.12.15 | 758089 | 35 | 420.00 | 14,700.00 | කසළ ප්‍රවාහනය |
| 3 | 2022.12.21 | 758093 | 35 | 420.00 | 14,700.00 | කසළ ප්‍රවාහනය |
| 4 | 2022.12.29 | 758097 | 35 | 420.00 | 14,700.00 | කසළ ප්‍රවාහනය |
| එකතුව | | | **140** | | **58,800.00** | |

වල් කපන මැෂිම

| ඇණවුම් දිනය | ඇණවුම් අංකය | ඉන්ධන ප්‍රමාණය (ලීටර්) | | ඒකක මිල (රු) | | මුළු වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|
| | | පෙට්‍රල් | ඔයිල් | පෙට්‍රල් | ඔයිල් | |
| | | | | | - | |
| එකතුව | | | | | - | - |

RX 1456 ජල මෝටරය

| ඇණවුම් දිනය | ඇණවුම් අංකය | ඉන්ධන ප්‍රමාණය (ලීටර්) | | ඒකක මිල (රු) | | කාරණය |
|---|---|---|---|---|---|---|
| | | | | | - | |
| | | | | | - | |
| එකතුව | | | | | - | |

ZA 5003 බැකෝ ලෝඩරය

| අනු අංකය | ඇණවුම් දිනය | ඇණවුම් අංකය | ඉන්ධන ප්‍රමාණය | ඒකක මිල ( රු) | මුළු වටිනාකම | කාරණය |
|---|---|---|---|---|---|---|
| 1 | 2022.12.16 | 758087 | 80 | 420.00 | 33,600.00 | කසළ බැහැර කිරීමේ ස්ථානය සැකසීම. |
| එකතුව | | | **80** | | **33,600.00** | |

**2022** දෙසැම්බර් මාසය **01** වැනිදා සිට **30** වැනිදා දක්වා

**270-1735** ට්‍රැක්ටර් රථය

| අනු අංකය | ඇණවුම් දිනය | ඇණවුම් අංකය | ඉන්ධන ප්‍රමාණය | ඒකක මිල ( රු) | මුළු වටිනාකම | කාරණය |
|---|---|---|---|---|---|---|
| 1 | | | | | - | |
| එකතුව | | | **0** | | - | |

**YTS TON 02** ගල් රෝල

| අනු අංකය | ඇණවුම් දිනය | ඇණවුම් අංකය | ඉන්ධන ප්‍රමාණය | ඒකක මිල ( රු) | මුළු වටිනාකම | කාරණය |
|---|---|---|---|---|---|---|
| 1 | 2022.12.12 | 758084 | 10 | 420.00 | 4,200.00 | තල්දෙන ප්‍රදේශයේ මුදල් ගෙවන ලද වැඩකට යෑටම |
| එකතුව | | | 10 | | 4,200.00 | |

**YTS TON 08** ගල් රෝල

| අනු අංකය | ඇණවුම් දිනය | ඇණවුම් අංකය | ඉන්ධන ප්‍රමාණය | ඒකක මිල ( රු) | මුළු වටිනාකම | කාරණය |
|---|---|---|---|---|---|---|
| 1 | 2022.12.01 | 383423 | 100 | 430.00 | 43,000.00 | L.මුදල් ගෙවන ලද වැඩකට යෑමට |
| 2 | 2022.12.09 | 758083 | 100 | 420.00 | 42,000.00 | කරමැටිය ප්‍රදේශයේ මුදල් ගෙවන ලද වැඩකට යෑම |
| එකතුව | | | **200** | | **85,000.00** | |

මූලාසනයෙන් අවසරය ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.චමින්ද ප්‍රදීප් මැතිතුමා සභාව අමතමින්, **ZA-5003** බැකෝ ලෝඩරය සඳහා **2022.12.16** දින ඉන්ධන ලීටර් **80**ක් ගහලා තියෙනවා. එකේ විස්තරය කොටසේ දලා තියෙන්නේ කසල ප්‍රවාහනය කියලා.

මූලාසනය සභාව අමතමින් පෙ.ව.**11.10**ට ගරු මන්ත්‍රීවරුනි,මේ මහා සභාව කාරක සභාවක් බවට පත් කිරීම සුදුසු බව, ගරු ප්‍රාදේශීය සභා සභාපති එස්.එම්.එල්.එච්.ජයවර්ධන මැතිතුමා යෝජනා කරන අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඩබ්.එම්.සමන්ත කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මූලාසනය විසින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාව විමසා සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාව මත, මහා සභාව කාරක සභාවක් බවට පත් කිරීම ඒකමතිකව සභා සම්මත වූ බව ප්‍රකාශ කරන ලදී.

මූලාසනය සභාව අමතමින් පෙ.ව.**11.15**ට කාරක සභා අවස්ථාව මහා සභාවක් බවට පත් කිරීම සඳහා ගරු ප්‍රාදේශීය සභා සභාපති එස්.එම්.එල්.එච්.ජයවර්ධන මැතිතුමා යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඩබ්.එම්.සමන්ත කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මූලාසනය විසින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාව විමසා සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාව මත, කාරක සභාව මහා සභාවක් බවට පත් කිරීම ඒකමතිකව සභා සම්මත වූ බව ප්‍රකාශ කරන ලදී.

කාරක සභා අවස්ථාවේදී, **ZA-5003** බැකෝ ලෝඩරය සඳහා ඉන්ධන සැපයීම සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදී.

ඒ අනුව, **ZA-5003** බැකෝ ලෝඩරය සඳහා **2022.12.16** දින ඉන්ධන ලීටර් **80** වැය වූ ආකාරය සම්බන්ධව ඉදිරි සභා වාරය සඳහා වාර්තාවක් ඉදිරිපත් කරන ලෙසත්, ඊට අදාලා විස්තරයේ කසල ප්‍රවාහනය ලෙස සඳහන් වෙලා තිබෙන ඒක සංශෝධනය කර කසල බැහැර කිරීමේ ස්ථානය සැකසීම ලෙස සංශෝධනය කරන ලෙස සභාව විසින් තීරණය කරන ලදී.

මූලාසනයෙන් අවසරය ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඩබ්.එම්.සමන්ත කුමාර මැතිතුමා සභාව අමතමින්, ඩබ්.කේ.එච්.නුවන් පුංචිලෝකාන්තයේ සේවයේ යොදවා ගැනීම සඳහා සභාවේ අනුමැතිය හම්බ වුනේ නොවැම්බර් මසේ සභාවේදී. එතකොට කොහොමද එයට සැප්තැම්බර්, ඔක්තෝම්බර් මාසේ සේවය කිරීම වෙනුවෙන් ගෙවීම් කරලා තියෙනවා.

ඒ අනුව, ඩබ්.කේ.එච්.නුවන් මහතාට 2022 සැප්තැම්බර්,ඔක්තෝම්බර් මස වල ගෙවන ලද දෛනික වැටුප් ගෙවීම සම්බන්ධව පළාත් පාලන කොමසාරිස්තුමාගේ උපදෙස් අරගෙන එම ගෙවීම සම්බන්ධව අනුමැතියක් ගැනීමට පළාත් පාලන කොමසාරිස්තුමා වෙත යොමු කිරීමට සහ ඒ සම්බන්ධව ගැටළුවක් මතු වුනොත් එම ගෙවන ලද මුදල අය කර ගැනීමට සභාව විසින් තීරණය කරන ලදී.

ඉහත සංශෝධනයන්ට යටත්ව 2022 දෙසැම්බර් මස ආදායම්, වියදම් වාර්තා හා සභාවේ වාහන සඳහා ඉන්ධන භාවිතය පිළිබඳ වාර්තාව සම්මත කිරීමට සුදුසු බව, ගරු ප්‍රාදේශීය සභා සභාපති එස්.එම්.එල්.එච්.ජයවර්ධන මැතිතුමා යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඩබ්.එම්.සමන්ත කුමාර මැතිතුමා ස්ථිර කළේය.

ගරු සභාපතිතුමා හා සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතවය මත, 2022 නොවැම්බර් මස ආදායම්, වියදම් වාර්තා හා සභාවේ වාහන සඳහා ඉන්ධන භාවිතය පිළිබඳ වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

## ගරු මන්ත්‍රීතුමන්ලාගේ අදහස්

### ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්.නාමල් රත්නායක මැතිතුමා

මූලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්.නාමල් රත්නායක මැතිතුමා සභාව අමතමින්, පළමුවෙන්ම 2023 වර්ෂය සඳහා සියලු දෙනාටම සුභ වසරක් වේවා කියලා ප්‍රාර්ථනා කරනවා. හැබැයි ප්‍රාර්ථනා ඉෂ්ට කර ගන්න ඔක්කොටම ශක්තිය ධෛර්යය ලැබෙන්න ඕන. මං හිතනවා ඔක්කොටම මේ ප්‍රශ්නය දැනෙන්න ඇති. ඒක වඩාත් ඉස්සරහට තීව්‍ර වේවි. මොකද හෙට දවසේ අපි ඉන්න ක්‍රමවේදය සහ ගත කරන කාලය කියන්නේ හෙට දවස අවිනිශ්චිත අවස්ථාවක තියෙන තැනක තමයි ඉන්නේ. ඉතින් ඒකත් එක්ක 2023 වර්ෂය කියන්නේ අභියෝග ගත වර්ෂයක්. ඒ අභියෝග සියල්ලටම පොදු අභියෝගයක් තියෙන්නේ. ඒක මං හිතනවා ගෙදර ඉන්න බල්ලා පූසාටත් අභියෝගය තියෙනවා. මොකද ඒ අභියෝගයට බල්ලා පූසා වගකිවයුතු කොටස්කරුවෝ නෙවෙයි. හැබැයි ඔවුන් වගකිවයුතු කොටස්කරුවෝ විසින් ගත්තු තීරණ එක්ක ඔවුන්ටත් වන්දි ගෙවන්න වෙලා තියෙනවා. මං හිතනවා මේක ඔබ සියලු දෙනාට දැනෙන භාෂාවෙන් කිව්වොත් ඇත්තටම අපි ගන්නා ආහාර වේල පවා අපි මේ කාල වකවානුවට ගැලපෙන විදිහට වෙනස් වෙලා තියෙනවා. අපතේ යෑම සහ වෙනත් අවස්ථා වලට යොමු කිරීම සීමා සහිත වෙලා තියෙනවා. ඒත් එක්කම සියලු දෙනාටම දනට පිනට දෙන දේ යම්තාක් දුරකට සීමා වෙලා තියෙනවා. එතකොට තවත් කෙනෙකුට උදව් කරන්න තියෙන අවස්ථාව බොහෝ සේ හීන වෙලා තියෙනවා. එවැනි අවස්ථාවක තමයි අපි මේ ගත කරන්නේ. නමුත් මං හිතනවා හිටපු කාලය පුරාවටම අපිට හැකි උපරිමයෙන් මේ සභාවට මේ සභා බල ප්‍රදේශයේ ඉන්න ජනතාවට සේවයක් ඉෂ්ඨ සිද්ධ කරා කියලා. මං හිතනවා ඉදිරියේදීත් ඔබතුමන්ලාට කරන්න ශක්තිය ධෛර්යය ලැබේවා කියලා. කෙසේ නමුත් සියලු දෙනාටම සුභ නව වසරක් වේවා කියලා ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

### මීළඟට මූලාසන සභාව අමතා, මූලාසනය පිළිතුරු කතාව සභාවට ඉදිරිපත් කරන ලදී.

මූලාසනය සභාව අමතමින්, මගේ හිතන්නේ අලුත් අවුරුද්දේ 2023 වසරේ අපි 2018 ඇවිල්ලා විශාල දේශපාලන හැල හැප්පීම වලට ලක් වෙලා විශාල ගැටලුවකට ලක්වෙච්ච කණ්ඩායමක් වශයෙන් අපේ කණ්ඩායම විශාල වශයෙන් ප්‍රදේශයට කරන්න තිබුණ වැඩ බොහෝ සේ අපි බලාපොරොත්තු වුන දේවල් අපිට කරගන්න බැරි වුණා. එකක් තමයි අපිට එක කාලෙක දී ආණ්ඩු දෙපැත්තක තිබුණා. එක කාලෙකදී කොරෝනා හැදුනා. එක කාලෙකදී අරගලය තිබුණා. මේ සියලු එක එක හැදීම් තුළ අපි මන්ත්‍රීවරු වශයෙන් සමාජයට කරන්න පුළුවන් වැඩ ප්‍රමාණය බොහෝ අඩු වුණා. හැබැයි අපි එක්තරා කාලෙක දී අපි ගිය වසරට ඉස්සල්ලා වසරේ විශාල මාර්ග සංඛ්‍යාවක් අපි හැදුවා ප්‍රදේශයේ. අපි දන්නවා පිටමාරුවට යන්න බැරුව තිබුණේ අපි ඒ ටික හැදුවා. ඒ වගේම තව පොඩි පොඩි මාර්ග ටිකක් හැදුවා. අපි වැඩ නොකරා කියලා කියන්න බැහැ. අපි මීගහකිවුලට වතුර ප්‍රොජෙක්ට් එක ගෙනාවා. බඩුත් ගෙනාවා. හැබැයි ලෝක ආර්ථික මතයක් මෙතුමා කියන බල්ලො පූසොන්ගේ ප්‍රශ්න නම් මම දන්නේ නැහැ. බල්ලන්ට නම් කන්ඩ තියෙනවද දන්නෙත් නැහැ. ඒ නිසා අපේ ප්‍රදේශයට අපි ගෙනාවා ලොකු project එකක් පාරේ ඇවිදගෙන යන්න පුළුවන් ප්‍රොජෙක්ට් එකක් ගෙනාවා. ඒක කරගන්න බැරි වුණේ රටේ තිබුණු ආර්ථික අර්බුදයේ සහ ලෝක ආර්ථික අර්බුදය නිසා. ඒ මුදල් නැවත දන්වන තුරු නවත්තලා තියෙනවා. නමුත් නැවතත් බොහොම ඉක්මනින් මේ වසර තුළ අපිට පුළුවන් වෙනවා ඒ ජල යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරන්න. එහෙම වුනොත් අපි යමක් කරේ නැහැ කියලා කාටවත් කියන්න බැහැ. අපි වැඩ ටිකක් කරලා තියෙනවා. අපි මේ හැමෝම වැඩ කරලා තියෙනවා. සභාවක් වශයෙන් ආර්ථික වශයෙන් අපි ඉතාම දුර්වලයි. ඒක ඔබතුමාන්ලා දන්නවා. ඒක ආර්ථික දුර්වලතාවය මත අපිට ගොඩක් අපේ මන්ත්‍රීවරුන්ට අත පය දිග ඇරලා කොට්ඨාස වලට වැඩක් කරන්න අපිට සල්ලි තිබුණේ නැහැ. දැන් අපිට තියෙන ගැටලුත් එක්ක අපි විශාල අර්බුදයක තමයි ඉන්නේ. ඒ නිසා මං හිතනවා අපි අඩු ආදායම්ලාභී ප්‍රාදේශීය සභාවක් වශයෙන් විශාල කොටසක් කරන්න හොඳ මුලක් පාදලා දීලා තියෙනවා. පුංචි ලෝකාන්තේ ගැන අපි ලොකු වැඩ කොටසක් අවසන් කරලා තියෙනවා. අපිට බැරි වුණොත් අනාගතයේ දවසක මං හිතන්නේ මේ පුංචි ලෝකාන්තරේ කතන්දරේ සභාවේ ආර්ථිකය ගොඩනගා ගන්න වැඩසටහනක් වෙයි. සමහරවිට අපිට මිනිස්සු බනී අපි මොනාද කරේ කියලා. දැනට අපිට බැනගෙන යනවා. සමහර අපේ මන්ත්‍රීවරුන්ට දෝෂාරෝපණය කර ගෙන යනවා. ඒ මොන දේ කරත් අපි යමක් පක්ෂ පාට භේදයකින් තොරව කටයුතු කරපු ප්‍රාදේශීය සභාවක් විදිහට මම නම් සතුටු වෙනවා. අපි කිසිම කෙනෙක් එක්ක තරහ මරහ ඇති කර ගෙන නැහැ. අපේ යෝජනාවක් බෙදීමකට ලක් වෙච්ච අවස්ථාවක් අපිට හිතා ගන්නවත් බැරි තරම් අඩුවෙන් තියෙන්නේ. ඒ වගේම අපි ඔක්කොම එකතු වෙලා හැම වෙලාවෙම ප්‍රාදේශීය සභාව කරගෙන ගියා. හැමෝම යෝජනා වලට සවන් දුන්නා. මං හිතන්නේ වෙනත් ප්‍රාදේශීය සභාවක අපි දන්නවා විපක්ෂ නායකතුමා එතකොට උප සභාපතිතුමා එතකොට ජනතා විමුක්ති පෙරමුණේ සහෝදරයා යනකොට සභාපතිතුමා එනකොට කණ්ඩායම් තැනින් තැන කසුකුසු ගාල බොහෝම විරසක වෙලා යන්නේ. අපි හැමකෙනෙක්ම එකතු වෙලා කතා කරලා තේ එකක් බීලා අපි බොහොම සතුටින් යනවා. ප්‍රාදේශීය සභාවක් වශයෙන් අපි මෙතනට එන්න කිසි කෙනෙක් මේ ප්‍රාදේශීය සභාවට කිසිම මන්ත්‍රීවරයෙක් අකමැත්තක් තිබුණෙ නැහැ පක්ෂ පාට භේදයකින් තොරව. ඒක තමයි මං හිතන්නේ අලුත්ම වෙනස කියන එක මට හිතනවා. මේ ප්‍රදේශීය සභාව තුළින් මම දැක්කා. මම ප්‍රාදේශීය සභා 50කට 100කට ගිහිල්ලා තියෙනවා . මේ හැම එකකම අඩු ගානේ විපක්ෂ නායකතුමාත් එක්ක කණ්ඩායමක් ඉන්නවා උප සභාපතිතුමාත් එක්ක කණ්ඩායමක් ඉන්නවා ජනතා විමුක්ති පෙරමුණ සහෝදරයත් එක්ක තවත් කණ්ඩායමක් ඉන්නවා වෙනත් පක්ෂවල කණ්ඩායම් ඉන්නවා. කණ්ඩායම් එකතු වෙලා රණ්ඩු කරගෙන ගහගෙන බැන ගෙන ඒ කිසිම දෙයක් වෙච්ච නැති කිසිම ගැටලුවක් වෙච්ච නැති ප්‍රාදේශීය සභාවක් වශයෙන් මේ වසර 5 අවසානය දක්වා අපට හොඳින් කරගෙන යාමට හැකියාවක් ලැබුණා. මම ඒ පිළිබඳව සතුටු වෙනවා. ප්‍රාදේශි සභාව මන්ත්‍රීවරුනි ඔබතුමාලා ඉතාම බුද්ධිමත්. ඒ වගේම ඔබතුමාලත් අපිත් ඔක්කොම එකතු වෙලා වැඩක් කරන්න පුළුවන් හැකියාවක් ලැබුණා. හැබැයි මෙකත් සමාජය තුළදී විවේචනයට ලක් වෙනවා සභාපතිතුමාට කඩේ යනවා විපක්ෂ නායකතුමා උප සභාපතිතුමා ජනතා විමුක්ති පෙරමුණේ සහෝදරයා හැබැයි මට එහෙම කඩේ යෑමක් කවුරුවත් කරලත් නැහැ මම කවුරුත් කඩේ යවලත් නැහැ. මොකද අපි ඔක්කොම එකට හිටිය ටීම් එකක් වශයෙන් වැඩ කරා. මොකද අපි ඔක්කොටම සවන් දීපු නිසා ජනතා විමුක්ති පෙරමුණ කියන්නේ වෙනත් මතයකට රටේ යන කණ්ඩායමක්. එතුමා වුණත් ඒ මත ඒ තනියෙන් යාමට හැකිවුනේ නැහැ. මොකද අපිත් ඒ මතයේ හොඳ කෑලි ටික තෝරලා අපි කණ්ඩායමක් වශයෙන් මම සභාපතිවරයා වශයෙන් අපි ඔක්කොම අතරේ බෙදලා දීල තියෙනවා. ඒ නිසා එතුමාට වුණත් මේ පක්ෂයේ මේ ප්‍රාදේශීය සභාව මේ පොදුජන පෙරමුණේ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට මන්ත්‍රීවරුන්ට එහෙම

කෙනෙහෙලිකම් කරන්න හැකියාවක් තිබුනේ නැහැ. මොකද එතුමා අපි හලලා ගෙනිච්චේ නැහැ. එතුමා විතරයි අපේ බජට එහෙක දී විරුද්ධ වෙන්නේ. ඒ විරුද්ධ වුණත් එතුමාට මේ ප්‍රාදේශීය සභාවෙන් රුපියලක් ලැබෙන්න තියෙනවද අපි එක එතුමාටත් නොදී කෙනෙහෙලිකම් කරේ නැහැ. ඒ නිසා ප්‍රාදේශීය සභාවක් වශයෙන් අපි ඉතාමත් සතුටුදායක ඒ විදිහට මේ වසර ගණනාව ගෙනියන්න පුළුවන් වුණා. සෑම මන්ත්‍රීවරයෙකුටම මෙතන ඇවිල්ලා වාඩි වෙලා තමන්ගේ කටයුතු කර ගන්න මම අවස්ථාව සලසලා දීලා තිබුණා. කපිල මන්ත්‍රීතුමා උඩලකුඹුර මන්ත්‍රීතුමා පහුගිය කාලේ අපි මේ ප්‍රාදේශය සභාවේ හිටපු මන්ත්‍රීවරු කාලයේ අපිට ඇවිල්ල මෙතන වාඩි වෙලා ඉන්න තැනක් තිබුනේ නැහැ රංගන මන්ත්‍රීතුමාත් හිටියා. ඒ කාලේ අපිට වාහනයක් යන්න පුළුවන් හැකියාවක් තිබුනේ නැහැ. ඒ අවස්ථා අඩුවෙන් ඒ සභාපතිවරු සැලකුවේ. ඒ සියලු දේවල් අපි දැනගෙන අපි සමහර දවස් වල උඩලකුඹුර මන්ත්‍රීතුමාත් මමත් දේශපාලන කටයුතු වලට යන කොට ත්‍රිකුණාමලයට ගියේ අපේ පෞද්ගලික ධනයෙන් කාර් එකක් හයර් එකට අරන්. හැබැයි මගේ මන්ත්‍රීවරුන්ට මම පුළුවන් කිසිම දවසක තනියෙන් යවලා නැහැ. මොනාද අවශ්‍යතාවය තියෙන්නේ ඒ අවශ්‍යතාවයට මට පුළුවන් ආකාරයට උප සභාපතිතුමා මගෙන් උදව් ඉල්ලලා තියෙනවා එතුමාට එතුමාගෙ ක්ලබ් එකේ වැඩ වලටත් මට පුළුවන් ආකාරයට රාජකාරි මට්ටමෙන් හෝ පෞද්ගලික මට්ටමෙන් වාහන ලබලා දීලා තියෙනවා. ජනතා විමුක්ති පෙරමුණේ සහෝදරයා ඕන උදව්වක් ඉල්ලුවත් මම කරල දීලා තියෙනවා. සියලුම මන්ත්‍රීවරුන්ට මට පුළුවන් ආකාරයට හැම උදව්වක්ම කරලා දීලා තියෙනවා. හැබැයි ඒ කුහක කමක් නැති නිසා තමයි මේ දේශපාලන ගමන අපි සතුටින් හෙට අනිත් අපි ඔක්කොටම අවසන් කරන්න වෙයි. එහෙම නැත්නම් තව මාස හයක් අපිට යන්න වෙයි. අපිට සතුටින් අවසන් කරන්න පුළුවන්. මොකද හේතුව අපි ජනතාවගේ දේවල් අපි මංකොල්ල කෑවේ නැහැ. මම මේ අවුරුදු හතර තුළ මම ඉතාම අපහසුතාවයට මම ඉතාම දෝෂරෝපනයකට ලක් වුණා. මම මිනිස්සුන්ගෙ ව්‍යාපාරික ස්ථාන අයින් කරේ නැහැ කියලා. විශේෂයෙන්ම අනවසර ඒ ස්ථාන මම එහෙම එකක් වත් අයින් කරේ නැහැ. ඇයි ඒ අයින් කරේ නැත්තෙ, මමත් වීදියෙ ඉඳලා අපි පුංචි කාලේ මාර්කට් එකේ පොලේ ව්‍යාපාර කරලා මගේ කඩේ දෙවරක් ප්‍රාදේශීය සභාව කඩලා විනාශ කරලා දැම්මා ඒ හිටපු සභාපතිවරයා ඒ පෞද්ගලික තරහ වලට. හැබැයි මට ඒ ගොල්ලන්ගෙ හිතවත් අය ඕන තරම ඒ දේවල් කරන්න තිබුනා ඒ උනාට මම කරේ නැහැ. මගේ අඩුපාඩුවක් නෙමෙයි මමත් හොඳටම දන්නවා මටත් පළාත් පාලන නීතිය ගැන හොඳ හසල දැනුමක් තියෙනවා. මට හුඟක් උපදේශකයෝ ඉන්නවා. මටත් ඕවා කඩලා ඉවර කරන්න තිබුණා. මම ඒවා කඩලා ඉවත් කරේ නැත්තෙ අහිංසක මිනිස්සු ජීවත් වෙන්න ඕන. ඒවා කඩලා ඉවත් කරනවා නම් ඒ මිනිස්සුන්ට තැනක් දෙන්න ඕන. ඒ මිනිස්සුන්ගෙ ජීවනාලිය නැති කරන්න හොඳ නැහැ. ඒ නිසා සභාව මට ඇඟිල්ල දික් කරලා කිව්වත් සමහර අපේ පක්ෂය කිව්වා විපක්ෂයේ අය කිව්වා වෙළඳ සංගමයේ මට කිව්වා මගේ මස්සිනා මට චෝදනා කරා මිනිස්සු මෙචගේන් ඉවත් කරන්න කියලා. පාසල්වල විදුහල්පතිවරුන් ඊයෙ පෙරේදත් මෙතැන අහිංසක මනුස්සයෙක් බුලත් විට විකුණනවා එතුමා ඒ අහිංසක මනුස්සයාව එළවලා තියෙනවා. එතුමාට අයිතියක් නෑ එහෙම කරන්න විදුහල්පතිවරයෙක් දැනගන්න ඕන තමන්ගේ දූ දරුවෝ ටික නිවැරදිව හදාගන්න. ගමේ අහිංසක මනුස්සයෙක් බුලත්විට විකුණද්දි එළවලා හරි යන්නේ නැහැ. ඒ මිනිස්සු අපිට දෝෂාරෝපණය කරනවා. මීගහකිවුල නගරයේ ඉන්න තරුණයා අපිට දෝෂාරෝපණය කරා පහුගිය කාලේ පුරාවටම. අපේ මන්ත්‍රීවරු ඔක්කොටම දෝෂාරෝපණය කරයි. හැබැයි අපි ඔය මිනිස්සුන්ට කවදා හරි දැනෙයි ඇයි අපි දෙයක් කරේ නැත්තෙ කියලා. අපි ප්‍රොජෙක්ට් එකක් අපි මිනිසුන්ට ඊළඟට එන සභාපතිවරයා මම වෙන්න පුළුවන් ඔබ වෙන්න පුළුවන් මේ සියලු දෙනා වෙන්න පුළුවන් නැත්නම් වෙනත් කෙනෙක් වෙන්න පුළුවන් ඒ එන කෙනාට යමක් කරන්න පුළුවන් මහක් අපි හදලා දීලා තියෙනවා. අපි හෙට අනිද්දටම කොයිකා ප්‍රොජෙක්ට් එක ගේනවා. හෙට අනිද්දට මේ ජනතාව විශේෂයෙන්ම මන්ත්‍රීවරුනි, මම ඔබතුමාලගෙන් විශේෂ ඉල්ලීමක් කරනවා. මේ මීගහකිවුල ප්‍රාදේශීය සභාව ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමා ඔබතුමා ලොකු කාර්යභාරයක් තියෙනවා. මොකද ගොඩක් පාරට බහින්න ඉන්න ටීම් එකක් ඉන්නේ ඔබතුමාත් එක්ක. ඔබතුමා වැරදි විදියට තේරුම් ගන්න එපා. අපි කොයිකා ප්‍රොජෙක්ට් එක මීගහකිවුලට අනුමත කර ගත්තා. ඒ කියන්නේ අපිට ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයක් මෙක අපි කරන්නේ මීගහකිවුල මිනිස්සුන්ට රැකියා අවස්ථා දෙසියක් විතර ලබලා දෙන්න පුළුවන්. එතකොට මීගහකිවුල ප්‍රාදේශීය සභාවට සාමාන්‍ය මාසික ආදායම ලක්ෂ 30 කට එහා ගන්න පුළුවන්. ඔබතුමාලා දන්නවා අපි මෙතන ඇවිල්ලා අපිට දැන් මෙතන ෆයිල් එකක් නැහැ. අපිට කොළයක් දාගෙන යන්න ලියුම් කවරයක් ගන්න තැනක් නැහැ. බොහොම අමාරුවෙන් අපි යන්නේ. අපේ මන්ත්‍රීවරුන්ට හදිසි දීමනාවක් දෙන්න විදිහක් නැහැ. කැඩිච්ච බෝක්කුවක් හදලා දෙන්න විදිහක් නැහැ. මම වැඩි හරියක් ජීවත් වෙන්නේ මහනුවර කුණ්ඩසාලේ ඒ කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාවේ ෆික්ස් ඩිපොසිට් එක කෝටි 95 ඒවගේ තියෙන ප්‍රාදේශීය සභා තියෙනවා. එතකොට අපිට තියෙන්නෙ මොනාද අපිට ඇති දෙයක් නැහැ. අපිට අද තියෙන තෙල් බිල ගෙවන්න සතියක්වත් ඉන්නවා තෙල් බිල ගෙවා ගන්න බැරිව. අපිට ආදායම නෑ ඒක නිසා කොයිකා වගේ ප්‍රොජෙට් එකක් ගෙනාවම ඔබතුමාල දැනුවත් වෙන්න. මෙකෙන් අපි කරන්නේ අපි තලාවතැන්නෙ අක්කර 8 ක ඉඩමක් වන රක්ෂණ දෙපාර්තමේන්තුවෙන් අරගෙන අපි ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයක් හැබැයි මෙක ලංකාවේ කොහෙවත් නාම හදපු නැති අලුත් ක්‍රමවේදයකට හදන කොරියාවේ ප්‍රොජෙක්ට් එකක්. මේ කොරියානු ප්‍රොජෙක්ට් එකෙන් අපිට පුළුවන් විශාල වැඩ කොටසක් කරන්න. අපි නැති වෙයි ඔබත් නැති වෙයි වෙනත් කෙනෙක් මේ ප්‍රාදේශීය සභාවේ ඉඳියි. ඒ මිනිස්සුන්ට කවද හරි කොන්ද පණ ඇතුව මේ ඉන්න මන්ත්‍රීවරුන්ට කීයක් හරි දීලා මේ මන්ත්‍රීවරුන්ගේ දේශපාලනය හදා ගන්න ඒ වගේම ගම හදන්න මිනිස්සුන්ට අවශ්‍යතා අපි දන්නවා පහුගිය දවස් වල ගෙවල් කඩාගෙන වැටිලා මිනිස්සු එනවා අපේ අනුගාමිකයෝ එන්නේ අපිට තහඩු දෙකක් දෙන්න බැහැ. මම තහඩු 50ක් දීල තිබ්බ නම් ඔබතුමාලා මෙකෙ සල්ලි තිබුණ නම් ඒක අනුමත කරනවා ඊළඟ සභාවේ දී ඒක මම දන්නවා. නමුත් අපි කොහොමද දෙන්නේ. අපි සමහර වෙලාවට මිනිස්සු හිතනවා අපි කවුරු වගේද අපි නිකං හිට්ලර් වගේ කියලා. ඇයි අපිට දෙන්න නැහැ අපිට දෙන්න තියෙනවා නම් අපි නොදී ඉන්නෙත් නැහැ. අපිට දෙන්න විදියක් නැහැ. ඒක අපේ මන්ත්‍රීවරු හොඳාකාරවම දන්න නිසා ඔබතුමාලා මෙච්චර කාලයක් බොහෝම සුහදව රැඳී සිටියා. ඒ නිසා මං හිතන්නේ ඉදිරි මේ කටයුතු වලද අපි ගියත් මේ සභාවෙන් ඔබතුමාලා ගියත් ඒ කොයිකා ප්‍රොජෙක්ට් එකට විරෝධතා ප්‍රකාශ කරන එක නවත්තන්න. ඒ සම්බන්ධව යම් දෙයක් තියෙනවා නම් මගෙන් අහගන්න අපි දන්නවා හෙට අනිද්දට ඔකට ඉදිරිපත් වෙනවා මන්ත්‍රීතුමාලා දේශපාලනයට එන්න ඉන්න කට්ටිය. පොහොට්ටුව වෙන්න පුළුවන් UNP එක වෙන්න පුළුවන් JVP වෙන්න පුළුවන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂ වෙන්න පුළුවන් හැම කෙනෙක්ම වෙන්න පුළුවන් ඒ ටීම් එක හෙට අනිද්දට විරෝධතා කරයි. හැබැයි අපි මෙවා කරන්නේ ප්‍රදේශයට විශාල සේවයක්. මොකද අපිට නැති ආදායමක් මේ ප්‍රාදේශීය සභාවට අරගෙන විශාල රැකියා අවස්ථා ගණනාවක් සම්පූර්ණ කරලා ඒ වගේම ඒකෙ හදනවා ලොකු හෝල් එකක්. අපේ තරුණ දරුවන්ට ගුරුවරුන්ට සියලු දෙනාටම අධ්‍යාපනය ලබලා දෙන්න එහෙම නවීන පන්නයේ ශ්‍රවණාගාරයක් හදනවා. ඉතිං මේ සියලු දේවල් තුළ මං හිතන්නේ ජනතාවට අකටයුත්තක් සිද්ධ වෙන්නේ නැහැ. හැබැයි බදුල්ලෙ කුණු මෙහෙට ගෙන්නෙත් නැහැ හැබැයි අපිට කුණු ගෙන්න වෙයි කොහෙන් හරි කොළඹින් හරි ගෙන්න වෙයි වැඩේ කරගෙන යන්න. හැබැයි අපිට මෙතන හුඟක් අපේ ඵලදායිතාවය තමයි අපි එතන නිර්මාණය වෙන්නේ. මං හිතන්නේ මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ තියන මේ ප්‍රශ්න නැති වෙයි. අපි හැමදාම අරක නෑ මෙක නැහැ මස් කඩේ නෑ මීගහකිවුලේ බාර් එකක් නැහැ මීගහකිවුලට මේ සියලු දේවල් නැතුව ආදායම නැහැ මීගහකිවුල කෝ සභාවෙන් කරන දේවල් කියලා ගමේ ජනතාව අහනවා පන්සලෙන් අහනවා කෝ සිමෙන්ති කොට්ට පහක් දෙනවාද ඔගොල්ලන් හැබැයි පන්සල විරුද්ධයි මේ සියලු දෙනා සමහර තැන් වලට. මං කියන්නේ අපි එළියට ඇවිල්ලා බැහැලා අලුත් විදියට හිතන system change එකක් එනවනේ. එහෙම වේන් එහෙකට යනකොට අපි බය නැතුව බැහැලා අපේ අර ඩයනා මන්ත්‍රීතුමිය කියනවා වගේ පිටරටින් dollars එනවනම් අපි යැව්වට ගැටළුවක් නැහැ. මගේ අදහසත් ඒක තමයි. එහෙම යවලා රටට සල්ලි ගෙන්න ඕන හැබැයි අපි හැදෙන්න අපි දැන ගන්න ඕන. මොකද බාර් කරන මුදලාලි කවදාවත් එයා අරක්කු බොන්නෙ නැහැ. බාර් එකක් අයිතිකාරයා එයා බියර් එකක්වත් බොන්නේ නැහැ. හැබැයි කොහෙවත් ඉන්න අය තමයි බොන්නේ. හැබැයි අපි දැන ගන්න ඕන එයාලට එහෙම ඉන්න පුළුවන් නම් අපි හැදෙන්න අපි අපේ ආර්ථිකයේ ගොඩනගා ගැනීමේදී අපි එක එක දේවල් වලට පොඩ්ඩක් යොමු වෙන්න ඕනෙ කියන 2023 වර්ෂයේ දී මම යෝජනා කරනවා. අපි ඉන්න පුළුවන් අපි නොවෙන්න පුළුවන් ලේකම්තුමියට හොඳ අදහස් වෙයි. ඒක නිසා ඒ කාරණා ටික කරන්න. ඒ වගේම අපිට LDSP එකෙන් අපිට ඉදිරියේදී විශාල මුදල් සම්භාරයක් හම්බ වෙනවා. ඒකත් මම දැන් මේ හැම කොටස් එකටම ඒකෙන් අපිට මුදල් කෝටියක් ලැබෙනවා. ලඟදිම ඒක අපි දාලා තියෙන හැම කොට්ඨාශයකටම ගොවි පවුල් සඳහා ආධාර උපකාර කරන්න පුළුවන් projector එකක්. මේ හැමෝගේම හැම කොට්ඨාශයකම අඩුගානෙ ගොවියකුට වතුර බටයක් මොන මොනා හරි ටිකක් දෙන්න පුළුවන්. අපිට පහුගිය කාලේ දෙන්න බැරි වෙච්ච දේවල් තිබුණා. අපි දන්නවා පොහොට්ටුවේ මන්ත්‍රීවරු වශයෙන් සහ ඔගොල්ලන් මං හිතන්නේ විමධ්‍යගත වලින් දාපු කිසි දෙයක් ගිය අවුරුද්ද තුළ අපිට නම් බෙදා ගන්න බැරි වුණා. සමහර අය බෙදාගත රංගන මන්ත්‍රීතුමා පොඩ්ඩක් බෙදාගත්තා දක්ෂතාවය මත. අපිට බැරි වුණා ඒ වගේ වෙලාවට අපේ මන්ත්‍රීවරුටත් යමක් බෙදන්න අපි හිටියොත් අපිට පුළුවන් වෙයි අරගෙන යන්න තව මාස දෙකක්. ඒ නිසා අපි රුපියල් 75000 යෝජනාව අපි අර කරමැටිය කඩ කාමර ටික බදු දීලා අපි ඒ මුදල අරගෙන එක ඉක්මනට කරනවා. අපි මේ මාසය ඇතුළත ඒ ටිකත් කරනවා. සමහරවිට අපිට භාගයක් හම්බ වෙයි ඉතිරි මුදල් ටික ලැබුනහම තවත්

75000ක් තව මාසයක් හිටියොත් ඒකත් ගෙවනවා ඔගොල්ලන්ට. මොකද අපි මිනිස්සුන්ට වැඩ කරල නැති නිසා අපි වැඩ කරන්න ඕන නිසා ජනතාව අතරට ඔගොල්ලන්ට යන්න ඕන නිසා යන්න පුළුවන් නිසා සාමාන්‍යයෙන් ලක්ෂ 50 ගානේ දෙනවා කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකුට. ඉතිං අපිට හරි දුක හිතනවා. මොකද ඒ තරම් මුදල් තියෙනවා ඒ ගොල්ලන්ට ඒ වගේ ආදායම් මාර්ග තියෙන නිසා. අපිත් ආදායම් මාර්ග හැමදාම නෑ නෑ කියලා අඩු ආදායම්ලාභී ප්‍රාදේශීය සභාවක් අපි හිඟන්නො කියන කතාව හැමදාම අපේ හිත්වල තියෙනවා. අපි මෙක වෙනස් කරනවා නම් අන්න ඒ ක්‍රමවේද වලට යන්න ඕනේ කියන එක මට නම් මේ අවුරුදු හතර තුළ මගේ අත්දැකීම් වලින් මං දැකලා තියෙනවා. ඒ නිසා මගේ මන්ත්‍රීවරුන්ගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා ඔබතුමාලට නැවතත් ලබන මාසය අපිට මේ වගේ වාඩි වෙලා ප්‍රාදේශීය සභාව කර ගෙන යන්න ශක්තිය ධෛර්යය ලැබේවායි කියලා ප්‍රාර්ථනා කරනවා. අපිට වැඩක් කරන්න පුළුවන් කාලෙක මෙක විසුරුවා හැරියොත් හොඳයි කියන අදහසෙන් තමයි මම නම් ඉන්නේ. අපිට වැඩක් කරගන්න බැරි වෙච්ච පහුගිය වකවානු හතර අයින් කරලා අපිටත් මාස තුන හතරක් හරි වැඩක් කරන්න කාලයක් ආවොත් අපේ මන්ත්‍රීවරුන්ට නැවතත් හොඳ ජයග්‍රහණයක් ලබලා ජනතාව අතර යම් යම් අපිට විරුද්ධව තියෙන අනවශ්‍ය මත අයින් කරලා ඔගොල්ලන්ට පුළුවන් වේවි හොඳ ගමනක් යන්න කියන සුභද ප්‍රාර්ථනාව ඔබට කරමින් 2023 වසර මගේ ගෞරවනීය මන්ත්‍රීතුමාලාටත් ඒ වගේම ප්‍රාදේශීය සභාවේ සියලු නිලධාරී මහත්ම මහත්මීන්ටත් ප්‍රදේශයේ ඉන්න සියලුම ජනතාවට ලංකාවාසී ලෝකවාසී සියලුම දෙනාටත් පහුගිය වසරේ තිබුණු පහුගිය කාලවල තිබුණු ඒ දුර්භික්ෂය නැති වෙලා හොඳ සුන්දර නව වසරක් වේවා කියලා ප්‍රාර්ථනා කරමින් අප සියලු දෙනාට සුබ නව වසරක් වේවා කියලා ප්‍රාර්ථනා කරනවා. අද දවස සභාව සාර්ථක කරගන්න පැමිණි උප සභාපතිතුමා, විපක්ෂ නායකතුමා ඇතුළු ගෞරවය මන්ත්‍රී මණ්ඩලයේ සියලු දෙනාටම ගෞරවනීය ස්තුතිය පුද කරනවා. ඒ වගේම ලේකම්තුමිය, නිලධාරීතුමිය ඇතුළු සියලු දෙනාටම ගෞරවනීය ස්තුතිය පුද කරනවා.

ඔබ සියලු දෙනාටම සුභ අනාගතයක් ප්‍රාර්ථනා කරනවා. බොහොම ස්තුතියි. මීලඟ සභා වාරය 2023.02.01 දින පැවැත්වීමට නියමිත බවද දැනුවත් කරන ලදි.

සභාපති
එස්.එම්.එල්.එච්.ජයවර්ධන
සභාපති
ප්‍රාදේශීය සභාව,මීගහකිවුල ප්‍රාදේශීය සභාව. මීගහකිවුල

2023/02/01.................................................. වන දින මීගහකිවුල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද මාසික මහ සභා රැස්වීමේදී ගරු ප්‍රාදේශීය සභා ~~උප සභාපති~~/ගරු මන්ත්‍රී S.M. රංගන [illegible]........... මැතිතුමා විසින් යෝජනා කිරිමෙන් හා ගරු ප්‍රාදේශීය සභා ~~උප සභාපති~~/ගරු මන්ත්‍රී R.P. කපිල අනුර [illegible].....මැතිතුමා විසින් ස්ථිර කිරිමෙන් 2023/01/03.................................. දින පැවැත්වූ මාසික මහ සභා රැස්වීම් වාර්තාව සත්‍ය වාර්තාවක් බව ඒකමතිකව පිළිගන්නා ලදි.

එස්.එම්.එල්.එච්.ජයවර්ධන,
සභාපති,
ප්‍රාදේශීය සභාව, මීගහකිවුල.

සභාපති
එස්.එම්.එල්.එච්.ජයවර්ධන
ප්‍රාදේශීය සභාව, මීගහකිවුල